CESL

සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්



වාර්ෂික වාර්තාව 2019

CECB හි පූර්ණ අයිතිය සහිත අනුබද්ධිත ආයතනයකි
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය
(ISO 9001, ISO 14001 & ISO 45001 - තත්ත්ව සහතික කළ සමාගමකි)

වාර්ෂික වාර්තාව 2019

පටුන

පිටුව

01. අප පිළිබඳව

අප කවුරුන්ද 1

දැක්ම, මෙහෙවර සහ සංයුක්ත අභිමතාර්ථ 2

සංවිධාන ව්‍යුහය 3

02. මූල්‍යමය විශේෂිතා 4

03. අධ්‍යක්ෂ මණ්ඩලය 5-7

04. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 8-9

05. විගණන කමිටු වාර්තාව 10

06. පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය 11-14

07. සේවා අංශ 15-16

08. ව්‍යාපාර මෙහෙයුම් සමාලෝචනය 17-19

09. මූල්‍ය ප්‍රකාශන

ස්වාධීන විගණකවරයාගේ වාර්තාව 20-30

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 31

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 32-33

සමකොටස් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය 34

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය 35-36

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 37-66

10. වර්ෂ හයක සාරාංශය 67

ඇතුළු පිට කවරය - සංයුක්ත තොරතුරු

01 අප පිළිබඳව

අප කවුරුන්ද

"සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් යනු ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ (CECB) පූර්ණ හිමිකාරිත්වය දරන සමාගමක් වන අතර 1982 දෙසැම්බර් 17 වන දින සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2009 නොවැම්බර් මාසයේදී නැවත ලියාපදිංචි කර ඇත."

මෙම කාලසීමාව තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඇති වූ උත්පාතයේ ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් සේවා සඳහා ඇති වූ ඉහළ ඉල්ලුම නිසා ඇති වූ අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම සඳහා 2011 වර්ෂය ආරම්භයේදී CESL සක්‍රිය ලෙස මෙහෙයුම් ආරම්භ කරන ලදී. CECB සමඟ වැඩ කිරීමෙන් ඉදිකිරීම් කළමනාකරණය සහ තාක්ෂණික නිරාවරණ ලබා ගැනීම මෙන්ම ඒ හරහා ලබා ගත් ව්‍යාපෘති කළමනාකරණය දැනුම් හැකියාවද සමඟින් CESL කර්මාන්තය විසින් ඉදිරිපත් කරන ලද අභියෝගයන්ට මුහුණ දුන්නේය. ගොඩනැගිලි, මාර්ග, පාලම්, වාරිමාර්ග ව්‍යූහයන් සහ වෙනත් විශේෂ ව්‍යාපෘති ඉදිකිරීම මත මූලික ව්‍යාපාරය කේන්ද්‍රගත වී ඇත. සිය ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් හා ඇස්ෆාල්ට් නිෂ්පාදනය කිරීමෙහිද සමාගම නිරතව සිටී.

CESL ඉදිකිරීම් රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවාදායකයන්ට සේවා ලබා දෙයි. සියලුම ආකාරයේ ආයතනික ඉදිකිරීම් ව්‍යාපෘති කෙරෙහි කාල ඉලක්ක සපුරා ගැනීමෙන් CESL රජයේ නිලධාරින්ගේ, ව්‍යාපාරික නායකයින්ගේ සහ පරිපාලකයින්ගේ විශ්වාසය දිනාගෙන ඇත. 1973 දී CECB පියස යටතේ උපදේශකයන් ලෙස අප කර්මාන්තයට පිවිසීම, වර්තමානයේ අභිප්‍රේරණ ප්‍රභවයක් ලෙස ක්‍රියා කරන පාඩම් රාශියක් අපට උගන්වා ඇත. තවද CECB හි EPC අංශය යටතේ ලබාගත් ඉදිකිරීම් අත්දැකීම් තිරසර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කරයි.

දැක්ම

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ අද්විතීය ආදර්ශය වීම.

මෙහෙවර

දායකත්වය ප්‍රමාණවත් ලෙස හඳුනාගන්නා ලද ඉහළ අභිප්‍රේරණයක් සහිත කාර්ය මණ්ඩලයක් සමඟින් ඉදිකිරීම් තාක්ෂණයේ විශිෂ්ටත්වය සහ නවෝපාදනය අත්පත් කර ගැනීම.

සංයුක්ත අභිමතාර්ථ

- සියලුම ක්‍රියාකාරී අංශ සඳහා ඒකාබද්ධ හා විනිවිද පෙනෙන කළමනාකරණ පද්ධතියක් ඇති කිරීම.
- අද්විතීය ගුණාත්මක, පාරිසරික, සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ පද්ධතියක් ඇති කිරීම.
- විවිධාංගීකරණය වූ ආයෝජන මගින් ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම.
- ඉදිකිරීම් කර්මාන්තයේ හොඳම මානව සම්පත් පදනම ඇති කිරීම.
- ස්වාධීන ලාභ ඉපැයීමේ ආයතනයක් ලෙස CESL වත්කම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම.
- ඉදිකිරීම් පිරිවැය ප්‍රශස්ත කිරීම සඳහා නවීන තාක්ෂණයන් භාවිතා කරමින් පද්ධති වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- ප්‍රමාණවත් පවතින වැඩ ප්‍රමාණයක් පවත්වාගෙන යෑම සහ ආයතනික තිරසරභාවය වර්ධනය කිරීම.

සංවිධාන ව්‍යුහය



* Chief Operation Engineer Sections in CESL : Western Province - 1, Noth Western Province, Western Province - 2, Central Province, Southern Province, Uva Province, Eastern Province, Sabaragamuwa Province, Anuradhapura, MKDP & Polonnaruwa, Northern Province

02 මූල්‍යමය විශේෂතා

	2019 රු.මි.	2018 රු.මි.	2017 රු.මි.	2016 රු.මි.	2015 රු.මි.	2014 රු.මි.
ඉදිකිරීම් ආදායම	10,447	11,189	12,294	8691	6,560	4,960
දළ ලාභය	781	786	682	621	448	254
බදු පෙර ශුද්ධ ලාභය	206	173	158	110	118	131
බදු පසු ශුද්ධ ලාභය	141	121	120	84	81	103
මුළු වත්කම්	12,681	12,616	12,345	9,942	6,385	5,729
දායක ප්‍රාග්ධනය	10	10	10	10	10	10
මුළු සමාගොටස්	604	421	422	302	218	136
මුළු සමාගොටස් සමතුලිතතාවය	12,681	12,616	12,345	9,942	6,385	5,729
ජංගම වත්කම්	12,207	12,181	11,865	9,544	5,978	5,327
ජංගම බැරකම්	10,421	10,565	10,329	8,245	5,001	4,307





ඉදිකිරීම් ආදායම (රු.මි.)					
2014	2015	2016	2017	2018	2019
4,960	6,560	8,691	12,294	11,189	10,447

මුළු වත්කම් (රු.මි.)					
2014	2015	2016	2017	2018	2019
5,729	6,385	9,942	12,345	12,616	12,681

03 අධ්‍යක්ෂ මණ්ඩලය



ඉංජී. ජී. ඩී. ඒ. පියතිලක මහතා - සභාපති

BSc.Eng. (Hons), PG.Dip. (Const.Mgt), PG.Dip. (Ports & Coastal Eng.) Norway, MIE (SL), C.Eng. MASCE

2011 දී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වූ අතර 2015 සිට මේ දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙස සේවය කරයි. CESL හි මව් සංවිධානය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ සභාපති ලෙස සමගාමීව කටයුතු කරනු ලැබේ.

ඔහු 1983 දී CECB හි නිර්මාණ ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. 1985 දී ඔහු වික්ටෝරියා ජල විදුලි ව්‍යාපෘතියේ නේවාසික ඉංජිනේරුවරයා බවට පත්විය. ඔහු ව්‍යාපෘති කළමනාකරු / උපදේශක සහ ව්‍යාපෘති කළමනාකරු / ඉදිකිරීම් ලෙසද සේවය කර ඇත. ඔහු 2005 දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (WP 1) සහ 2007 දී අතිරේක සාමාන්‍යාධිකාරී (WP 1) ලෙස සේවය කළේය. 2010 දී ඔහු CECB හි EPC අංශයේ ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරී ලෙස පත් කරන ලදී. සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 33 කට වැඩි පළපුරුද්දක් ඔහු සතු වේ.



ඉංජී. එන්. රූපසිංහ මහතා - අධ්‍යක්ෂ

BSc.Eng. (Hons), PG.Dip. (Hydropower) Norway, C.Eng. MIE (SL), MICE (London), Licd. Surveyor

2011 දී අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වූ ඔහු 2011 සිට 2014 දක්වා CESL හි සභාපතිවරයා ලෙස සේවය කළේය. ඊට සමගාමීව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ (CECB) අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරන ඔහු 2005 සිට 2014 දක්වා CECB හි සභාපතිවරයෙකු ලෙස සේවය කර ඇත.

ඔහු කාර්යාංශයේ වසර 35 කට වැඩි කාලයක් පුරා ඉංජිනේරු හා කළමනාකරණ අත්දැකීම් ලබා ඇති අතර 1981 දී CECB හි සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස සම්බන්ධ වී සිවිල් ඉංජිනේරු, නේවාසික ඉංජිනේරු, ප්‍රධාන නේවාසික ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරු, අතිරේක සාමාන්‍යාධිකාරී සහ සාමාන්‍යාධිකාරී ලෙස සේවය කර ඇත. ව්‍යාපෘති කළමණාකරු (යටිතල පහසුකම් ඉදිකිරීම) සහ අතිරේක සාමාන්‍යාධිකාරී (EPC) ලෙස ආරම්භ කරමින් ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (EPC) අංශය පිහිටුවීමට පුරෝගාමී විය.



ඉංජී එස්.පී.පී. නානායක්කාර මහතා - විධායක අධ්‍යක්ෂ

BSc.Eng. C.Eng., MICE (UK), MIE (SL)

2015 දී අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. 2016 සිට විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි. තවද, ඔහු දැනට CESL හි මව් සංවිධානය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි. ඔහු 2014 සිට 2016 දක්වා CESL හි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සේවය කළේය.

ඔහු සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ඇති අතර 1980 දී මාදුරු ඔය වාරිමාර්ග හා ජල විදුලි ව්‍යාපෘතියේ වැඩමුර ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

ඔහු සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ඇති අතර 1980 දී මාදුරු ඔය වාරිමාර්ග හා ජල විදුලි ව්‍යාපෘතියේ වැඩමුර ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඔහු 1984 දී රන්දෙනිගල ජලවිදුලි ව්‍යාපෘතියේ සිවිල් ඉංජිනේරුවෙකු ලෙස සහ 1988 දී සමනල වැව ජල විදුලි ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයෙකු ලෙස සේවය කළේය.ව්‍යාපෘති කළමණාකරුවෙකු ලෙස EPC - දකුණු පළාත් අංශය ආරම්භ කළ අතර 2006 සිට 2007 දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (EPC-SP) ලෙසත් 2007 සිට 2015 දක්වා අතිරේක සාමාන්‍යාධිකාරි (EPC-SP) 2016 සැප්තැම්බර් දක්වා ලෙසත් ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරි (EPC) ලෙසත් සේවය කළේය. ඔහු කාර්යාංශයේ සහ CESL හි වසර 36 කට වැඩි පුළුල් ඉංජිනේරු හා කළමනාකරණ අත්දැකීම් ලබා ඇත.



ඉංජී. ටී. ඩී. වික්‍රමරත්න මහතා - අධ්‍යක්ෂ

BSc.Eng. (Hons), B.Eng. PG.Dip. (Hydrology), MICE (UK), FIE (SL), C.Eng.

ඔහු 2014 දී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. මේ වනවිට CESL හි මව් සංවිධානය වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරි (උපදේශන) ලෙස සේවය කරයි. සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගත් ඔහු 1981 දී සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට සම්බන්ධ විය.

ඔහු සැලසුම් ඉංජිනේරුවරයෙකු, නේවාසික ඉංජිනේරුවරයෙකු, ව්‍යාපෘති කළමනාකරුවෙකු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු ලෙස සේවය කළ අතර 2006 දී අතිරේක සාමාන්‍යාධිකාරි (ජල සම්පත්) ලෙස පත් කරන ලදී. ඔහු 2015 දී උපදේශන කාර්යාංශයේ ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරි ලෙස පත් කරන ලදී. ඔහු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 35 කට වඩා වැඩි පළපුරුද්දක් ලබා ඇත.



ඉංජී. ඒ. ගල්කැටිය - අධ්‍යක්ෂක

BSc.Eng. C.Eng., MIE (SL)

2015 දී අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. මේ වනවිට CESL හි මව් සංවිධානය වන ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ ආයතනික අතිරේක සාමාන්‍යාධිකාරි (EPC - අංශය) ලෙස සේවය කරයි.

සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබාගත් ඔහු 1986 දී CECB හි පුහුණු ඉංජිනේරුවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. 1987 දී ඔහු සමනලවැව ජල විදුලි ව්‍යාපෘතියේ වැඩමුර ඉංජිනේරු (විදුලි බලාගාරය) ලෙස පත් කරන ලදී.

පසුව ඔහු උෑව පළාතේ නේවාසික ඉංජිනේරුවෙකු, ව්‍යාපෘති කළමනාකරුවෙකු ලෙස සේවය කළේය. 2005 දී ඔහු අතිරේක සාමාන්‍යාධිකාරි (EPC - කොළඹ උතුර) ලෙස උසස් කරන ලදී.

ඉන්පසු ඔහු අතිරේක සාමාන්‍යාධිකාරි (EPC-උෑව) සහ සබරගමුව බවට පත් විය. ඔහු සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර 30 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.



ඉංජී. ජී.ආර්.ඒ. එස්. ගුණතිලක - අධ්‍යක්ෂ

BSc.Eng. (Hons) Sri Lanka, MSc (Hydropower) Norway, MSc. (Struct) Sri Lanka, MIE (SL), C.Eng. MSSE (SL).

ඔහු 2019 දී අධ්‍යක්ෂ මණ්ඩලයට අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. ඔහු විසින් CECB සහ CESL සඳහා පුළුල් දායකත්වයක් ලබා දෙන ලදී. වසර 35 ක් පුරා සිවිල් ඉංජිනේරු, ස්ථානීය ඉංජිනේරු, සැලසුම් ඉංජිනේරු, නේවාසික ඉංජිනේරු, ප්‍රධාන නේවාසික ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ සැලසුම් ඉංජිනේරු, ව්‍යාපෘති කළමනාකරු, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, අතිරේක සාමාන්‍යාධිකාරී, සංස්ථානීය අතිරේක සාමාන්‍යාධිකාරී (උපදේශන), සාමාන්‍යාධිකාරී ආදි තනතුරුවල සේවය කරමින් පුළුල් අත්දකීම් ලබා ඇත.

නිර්මාණ සැලසුම්, ඉංජිනේරු ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (ඊපීසී) සහ ජල සම්පත් සංවර්ධනය පිළිබඳ වරලත් පුහුණුව ලැබූ තරුණ ඉංජිනේරුවන් සිය ගණනාවන් අතර ඔහු විශේෂඥයෙකු බවට පත්විය. ඔහු වර්තමානයේ පෙරාදේනිය විශ්ව විද්‍යාලයේ අධ්‍යයන හා පශ්චාත් උපාධි පර්යේෂණ සංචාර අධීක්ෂක ලෙස කටයුතු කරමින් සිටී.

04 අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව සහ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්හි අධ්‍යක්ෂවරුන් විසින් සතුටින් ඉදිරිපත් කර සිටී. 2007 අංක 07 දරණ සමාගම් පනත ප්‍රකාරව සමාගමේ කටයුතු පිළිබඳ අවශ්‍ය තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙම වාර්ෂික වාර්තාවේ අඩංගු වේ.

පොදු

සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් 1982 අංක 17 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කරන ලද අතර 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව සමාගම සඳහා ලබා දෙන ලද PV 16723 නව අංකය යටතේ 2009 නොවැම්බර් 6 වන දින නැවත ලියාපදිංචි කරන ලදී.

සමාගමේ මූලික ක්‍රියාකාරකම් සහ වසර පුරා කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල සටහන් අංක 1.2 හි සඳහන් වේ. මූල්‍ය ප්‍රකාශන සමඟ මෙම වාර්තාව සමාගමේ කටයුතුවල තත්ත්වය පිළිබිඹු කරයි.

මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණකවරුන් වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි පරිදි අත්සන් කරන ලද නිශ්චිත අනාවරණය කිරීම් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සකස් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති අතර ඒවා වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය කොටසක් වේ.

ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව 20 සිට 30 දක්වා පිටුවල දක්වා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වාර්ෂික වාර්තාවේ 31 සිට 66 දක්වා පිටුවල දක්වා ඇත. සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRSs සහ LKASs) අනුව සකස් කර ඇති අතර ඒ සඳහා අනුගමනය කරන ප්‍රතිපත්ති 31 සිට 66 දක්වා පිටුවල දක්වා ඇත.

මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

සමාගමේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ දෘෂ්ටියක් පිළිබිඹු කිරීම සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKASs) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

විගණකවරුන්

සමාලෝචන වර්ෂය තුළ විගණකාධිපති දෙපාර්තමේන්තුව (AGDSL) විගණකවරුන් ලෙස කටයුතු කළේය.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 10,000,020/- වේ. මෙය සාමාන්‍ය කොටස් 100,002 නියෝජනය කරයි.

සංචිත

වර්ෂය තුළ චලනයන් සහිත සමාගමේ සංචිත, 34 වන පිටුවේ කොටස්වල වෙනස්වීම් ප්‍රකාශයේ දක්වා ඇත.

ව්‍යවස්ථාපිත ගෙවීම්

සමාගම විසින් ගෙවිය යුතු සියළුම බදු, තීරුබදු සහ ගාස්තු සහ සමාගම වෙනුවෙන් ගෙවිය යුතු සියලුම දායක මුදල්, සහ බදු සහ ගාස්තු සහ සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලුම බදු සහ ගාස්තු, සහ මූල්‍ය තත්ව ප්‍රකාශ දිනයට සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා සියලුම ව්‍යවස්ථාපිත ගාස්තු ආදීය ගෙවා අවසන් කර හෝ අවශ්‍යවන විටක ඊට අදාල ප්‍රතිපාදන සලසා ඇති බව අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ උපරිම දැනුම මත තහවුරු කර සිටී.

ශේෂ පත්‍රය දිනට පසුව සිදුවන සිදුවීම්

විගණන වාර්තාවේ දිනය වන විට මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙලිකිරම් අවශ්‍ය කරන කිසිදු ද්‍රව්‍යමය සිදුවීම් සිදුවී නැත.

රැස්වීම් සහ පැමිණීම

මණ්ඩලය 2019 මූල්‍ය වර්ෂය තුළ අවස්ථා 09 කදී රැස්වූ අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ පැමිණීම පහත පරිදි වේ.

නම	තනතුර	2019								
		ජනවාරි 29	පෙබරවාරි 26	අප්‍රේල් 03	මැයි 28	ජූනි 25	ජූලි 30	සැප්තැ. 04	සැප්තැ. 26	නොවැම්. 06
ඉංජි. පී.ඩී.ඒ. පියතිලක	සභාපති	√	√	√	√	√	√	√	√	√
ඉංජි. එස්.පී.පී. නානයක්කාර	විධායක අධ්‍යක්ෂක	√	√	√	√	√	√	√	√	√
ඉංජි. එන්. රූපසිංහ	අධ්‍යක්ෂක	√	√	√	√	√	√	√	√	√
එම්.ආර්.ජී. රණතුංග	අධ්‍යක්ෂක	√	√	√	√	√	√	√	N/A	
ඉංජි. කේ.එල්.එස්. සහබන්දු	අධ්‍යක්ෂක	√	√	√	√	N/A				
ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න	අධ්‍යක්ෂක	√	√	√	√	√	√	√	√	√
ඉංජි. ඒ. ගල්කැටිය	අධ්‍යක්ෂක	√	√	√	√	√	√	√	√	√
එච්.එම්.එන්.යූ.බී. මාවතගම	අධ්‍යක්ෂක	√	√	√	√	N/A				
ඉංජි. ජී.ආර්.ඒ.එස්. ගුණතිලක	අධ්‍යක්ෂක	N/A							√	√

05 විගණන කමිටු වාර්තාව

විගණන කමිටුවේ කාර්යභාරය

CESL හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් CESL හි විගණන කමිටුව පත් කරනු ලැබේ.

රැස්වීම් සහ පැමිණීම

විගණන කමිටුව 2019 මූල්‍ය වර්ෂය තුළ අවස්ථා 03 කදී රැස්වූ අතර පැමිණීම පහත පරිදි වේ.

නම	තනතුර	2019		
		මාර්තු 21	අගෝස්තු 06	ඔක්තෝම්බර් 28
ඉංජී. ටී.ඩී. විකමරත්න	කමිටුවේ සභාපති	√	√	√
එම්.ආර්.ජී. රණතුංග	අධ්‍යක්ෂක	√	√	
ඉංජී. ඒ. ගල්කැටිය	අධ්‍යක්ෂක	√	√	√

කමිටුවේ විෂය පථය

අ) අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම.

ආ) ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම සහ ඇගයීම.

ඇ) පිරිවැය ඵලදායිතාවය සඳහා සහ නාස්තිකාර වියදම් ඉවත් කිරීම සඳහා ඒකාකාරී කාල පරිච්ඡේද අනුව කාර්ය සාධනය සමාලෝචනය කිරීම.

ඈ) බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වී විගණකාධිපතිගේ/බාහිර විගණකවරුන්ගේ කළමනාකරණ ලිපි පසු විපරම් කිරීම.

ඉ) ප්‍රඥප්ති, රෙගුලාසි, රීති සහ චක්‍රලේඛවලට අනුකූල වන්නේද යන්න නිශ්චය කිරීම.

ඊ) ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

උ) සුදුසු පියවර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම.

ඌ) රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම.

අධිකාරි බලය

i. කාරක සභාවට එහි යොමු කිරීමේ අනුදේශ තුළ කටයුතු කිරීමට මණ්ඩලය විසින් බලය පවරනු ලැබේ. ඕනෑම සේවකයෙකුගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට බලය පවරා ඇති අතර කමිටුව විසින් කරනු ලබන කවර හෝ ඉල්ලීමක් සම්බන්ධයෙන් සහයෝගයෙන් කටයුතු කිරීමට සියලුම සේවකයන්ට නියම කරනු ලැබේ.

ii. තම අවධානයට ලක්වන කිසියම් සැක සහිත වංචා හෝ අක්‍රමිකතා, අභ්‍යන්තර පාලනයේ අසමත්වීම් හෝ නීති, රීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම් පිළිබඳව කමිටුව මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

iii. අවශ්‍ය යැයි සලකන්නේ නම් බාහිර නීතිමය හෝ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සහ අදාළ පළපුරුද්ද හා විශේෂඥතාවයෙන් යුත් බාහිර පුද්ගලයන්ගේ පැමිණීම සහතික කිරීම.

06 පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය

2019 වර්ෂය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්						
තාක්ෂණ						
අනු අංක	දිනය	පුහුණු වැඩසටහනේ නම	ආයතනය	කාල සීමාව	සහභාගිවන්නන් සංඛ්‍යාව	ඒක පුද්ගල පිරිවැය
1	04.01.2019	ඉදිකිරීම් විනිශ්චය පිළිබඳ ඩිප්ලෝමාව - 2019	CIDA	මාස 6	2	120,000.00
2	05.01.2019	PRIMAVERA P6 පිලිබඳ CPD පාඨමාලාව (ව්‍යාපෘති කළමනාකරණ වැඩසටහන)	IESL	දින 5	1	22,500.00
3	25.01.2019	MEP ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන	CHPB	දින 4	3	15,000.00
4	25.01.2019	APT පාඨමාලාව - 24 වන කණ්ඩායම	GBCSL	දින 4	1	35,700.00
5	14.02.2019	ව්‍යුහාත්මක ප්‍රතිනිර්මාණය කළ කොංක්‍රීට් පිළිබඳ සම්මන්ත්‍රණය	CIDA	දින 1	10	4,000.00
6	15.02.2019	කොන්ත්‍රාත් කළමනාකරණය සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	CIDA	දින 40	1	100,000.00
7	28.02.2019	ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ දින දෙකක වැඩමුළුවක්	CETRAC	දින 2	1	7,000.00
8	03.03.2019	ශබ්ද කොන්ත්‍රාත් පරිපාලනය	මහාචාර්ය ඉන්ද්‍රවන්ස සමරතුංග	දින 3	3	6,500.00
9	07.03.2019	විනිශ්චය පිළිබඳ අත්දැකීම් පිළිබඳ සම්මන්ත්‍රණය - සිද්ධි අධ්‍යයන	CIDA	දින 1	13	4,000.00
10	09.03.2019	කර්මාන්තශාලා ආඥා පනත යටතේ ජීවන යන්ත්‍ර පරීක්ෂා කිරීම පිලිබඳ CPD පාඨමාලාව	IESL	දින 1	4 (M)	7,500.00
					1 (NM)	10,500.00
12	19.03.2019	යටිතල පහසුකම් ව්‍යාපෘති පරිපාලනය හා අධීක්ෂණය කාර්යක්ෂම කොන්ත්‍රාත්තුව සඳහා අත්‍යවශ්‍ය කරුණු පිළිබඳ එක් දින සම්මන්ත්‍රණයක්	CHPB	දින 1	3	3,500.00
13	23.03.2019	ගොඩනැගිලි සහ මහාමාර්ග ව්‍යුහයන් සැලසුම් කිරීම, ඉදිකිරීම සහ තත්ත්ව සහතික කිරීම සඳහා යුරෝ කේත පිළිබඳ පුහුණු වැඩසටහන	UOM	දින 8	1	50,000.00
14	25.03.2019	Huawei Lanka තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) සම්මේලනය 2019	හුආවි ශ්‍රී ලංකාව	පැය 2.5	2	නොමිලේ
15	27.03.2019	QA සහ QC පිළිබඳ එක් දින වැඩමුළුවක්	CECB	දින 1	32	නොමිලේ
16	27.03.2019	ප්‍රමිති පිළිබඳ මහජන අදහස් විමසීම සහ ජලය සඳහා නියාමන ක්‍රියාමාර්ග	මහජන උපයෝගිතා කොමිෂන් සභාව	දින 1	1	නොමිලේ
17	28.03.2019	අකුණු ආරක්ෂණ තාක්ෂණය පිළිබඳ ප්‍රධාන පාඨමාලාව	D & R ව්‍යාත්තීය සංවර්ධනය	දින 3	1	39,000.00
18	28.03.2019	පූර්ව කොන්ත්‍රාත් කළමනාකරණය පිළිබඳ එක් දින සම්මන්ත්‍රණයක්	CHPB	දින 1	21	3,500.00
19	29.03.2019	අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	UOP	දින 2	1	13,000.00
20	01.04.2019	ගැඹුරු බිම් මහල සැලසුම් කිරීම හා ඉදිකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය (SSESL)	SSESL	දින 1	1	6,000.00
21	07.04.2019	ජලනල ඉංජිනේරු පිලිබඳ CPD පාඨමාලාව - 2019	IESL	දින 11	2	38,500.00
22	28.04.2019	දත්ත විද්‍යා මූලධර්ම හරහා ව්‍යාපාර විශ්ලේෂණ පිලිබඳ CPD C පාඨමාලාව	IESL	දින 8	1	25,000.00
23	03.05.2019	APT පාඨමාලාව - 25 වන කණ්ඩායම	GBCSL	දින 4	3	42,000.00
24	08.06.2019	FIDIC යටතේ වෙනස්වීම් සහ ප්‍රමාද හිමිකම්	SLQS	දින 1	21	5,000.00
25	19.06.2019	"උස් ගොඩනැගිලි සඳහා දැක්ම 4" පිළිබඳ සම්මන්ත්‍රණය	SSESL	දින 1	2	6,000.00
26	21.06.2019	PRIMAVERA P6 ව්‍යාපෘති කළමනාකරණ පිලිබඳ CPD පාඨමාලාව	IESL	දින 5	1	22,500.00
27	21.06.2019	අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	UOP	දින 2	1	13,000.00

2019 වර්ෂය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්						
තාක්ෂණ						
අනු අංක	දිනය	පුහුණු වැඩසටහනේ නම	ආයතනය	කාල සීමාව	සහභාගිවන්නන් සංඛ්‍යාව	ඒක පුද්ගල පිරිවැය
28	27.06.2019	නේවාසික සහ වාණිජ ගොඩනැගිලිවල LPG පද්ධති ස්ථාපනය කිරීම	CIDA	දින 1	5	4,000.00
29	09.07.2019	ව්‍යාපෘති කළමනාකරණ වෘත්තික (PMP) පිලිබඳ CPD පාඨමාලාව	IESL	පැය 2.5 x 20	1	22,000.00
30	12.07.2019	IIESL හි තාක්ෂණික සැසිය	IIESL	දින 1	3	1,000.00
31	19.07.2019	ආයතනික ප්‍රසම්පාදන හා සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	CETRAC	දින 1	9	4,000.00
32	20.07.2019	උස් ගොඩනැගිලි සඳහා ජලනල කාර්මික කටයුතු පිළිබඳ දෙදින වැඩමුළුව	CETRAC	දින 2	1	12,000.00
33	23.07.2019	ඉදිකිරීම් උපකරණවල විදුලි පද්ධති නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව	CETRAC	දින 4	2	13,860.00
34	24.07.2019	ඉදිකිරීම් කර්මාන්තයේ සිහින් පිළිවෙත් හඳුන්වාදීම	CIOB	දින 1	22	10,000.00
35	25.07.2019	සිවිල් ඉංජිනේරු සහ යෙදුම් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව 2019	UOM	දින 2	3	නොමිලේ
36	25.07.2019	බලශක්ති ආරක්ෂාව සහ බලශක්ති කළමනාකරණ විකල්ප පිළිබඳ සම්මන්ත්‍රණය	CIDA	දින 1		4,000.00
37	28.07.2019	මයික්‍රොසොෆ්ට් ව්‍යාපෘතිය පිළිබඳ CPD පාඨමාලාව	IESL	දින 4	1	18,000.00
38	31.07.2019	වහල සූර්ය PV පද්ධති පිළිබඳ වැඩමුළුව	CETRAC	දින 2	6	12,000.00
39	01.08.2019	ඉදිකිරීම් වලදී කොන්ත්‍රාත් පරිපාලනයේ වැදගත් ලක්ෂණ පිළිබඳ සම්මන්ත්‍රණය	CIDA	දින 1		4,000.00
40	04.08.2019	HVAC පද්ධතිවල බලශක්ති කාර්යක්ෂම නත්වය සහ කාබන් පාද මුද්‍රණය අඩු කිරීම පිළිබඳ දෙදින වැඩමුළුව	CETRAC	දින 1		12,000.00
41	18.08.2019	වායු සමීකරණ පද්ධති සැලසුම් කිරීම පිළිබඳ CPD පාඨමාලාව	IESL	දින 10	2	32,000.00
42	20.08.2019	වාර්ෂික සැසිය 2019	SSESL	දින 1	2	5,000.00
43	21.08.2019	ශ්‍රී ලංකාවේ ජීවත් වන සභාධිපත්‍යයේ අනාගතය පිළිබඳ සම්මන්ත්‍රණය	CCI	පැය 5	4	2,000.00
44	22.08.2019	ජනක යන්ත්‍ර මෙහෙයුම් සහ නඩත්තු පිළිබඳ වැඩමුළුව	CETRAC	දින 2	3	8,000.00
45	26.08.2019	ආරම්භකයින් සඳහා ව්‍යවහාරික සීමිත මූලද්‍රව්‍ය විශ්ලේෂණය පිළිබඳ CPD පාඨමාලාව	IESL	දින 2	5	20,000.00
46	31.08.2019	යාන්ත්‍රික ඉංජිනේරු සැලසුම් පිළිබඳ CPD පාඨමාලාව	IESL	දින 13	1	39,000.00
47	03.09.2019	කළමනාකරණය, අඩු කිරීම පිළිබඳ එක් දින සම්මන්ත්‍රණයක්….	CIDA	දින 1	4	3,000.00
48	06.09.2019	ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් ලැබෙන ආදායම පිළිබඳ SLFRS - 15 සහ 16 සඳහා ප්‍රායෝගික ඇඟවුම් වැඩමුළුව		දින 1	3	3,000.00
49	19.09.2019	ශබ්ද කළමනාකරණය සහ මහජන ඇමතීම් පිළිබඳ වැඩමුළුව	CETRAC	දින 2	5	12,000.00
50	19.09.2019	SLGS වාර්ෂික සමුළුව 2019	SLGS	දින 1	1	10,000.00
51	20.09.2019	සිවිල් ඉංජිනේරු ව්‍යාපෘති සඳහා CESMM - SL භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන	CHPB	දින 6	5	20,000.00
52	21.09.2019	ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වල ආරවුල් විසඳීම පිළිබඳ එක් දින පුහුණු වැඩසටහනක්	UOP	දින 1	1	10,000.00
53	05.10.2019	මැහුම් වලින් සාදන ලද වැඩසටහන - තාක්ෂණික නිලධාරීන් සඳහා විදුලි ස්ථාපනය	UOP	දින 2	1	11,000.00
54	09.10.2019	අපද්‍රව්‍ය කළමනාකරණයේ හොඳම භාවිතයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව	IET	දින 1	1	8,000.00
55	10.10.2019	රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ දෙදින වැඩමුළුව	PDC	දින 2	13	12,500.00
56	11.10.2019	APT පාඨමාලාව - 27 වන කණ්ඩායම	GBCSL	දින 4	2	42,000.00

2019 වර්ෂය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්						
තාක්ෂණ						
අනු අංක	**දිනය**	**පුහුණු වැඩසටහනේ නම**	**ආයතනය**	**කාල සීමාව**	**සහභාගිවන්නන් සංඛ්‍යාව**	**ඒක පුද්ගල පිරිවැය**
57	12.10.2019	හරිත ප්‍රතිනය සඳහා උසස් ව්‍යක්තීය පාඨමාලාව	GBCSL	දින 2	4	24,000.00
58	15.10.2019	උස් ගොඩනැඟිල්ලේ ජලනල පද්ධතිය පිළිබඳ එක් දින සම්මන්ත්‍රණයක්	CHPB	දින 1	1	4,000.00
59	17.10.2019	අධීක්ෂණ කළමනාකරණය පිළිබඳ වැඩමුළුව	PDC	දින 1	13	8,900.00
60	18.10.2019	ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් නීතියේ මූලධර්ම සහ ආරවුල් විසඳීමේ පුහුණුව පිළිබඳ කෙටි පාඨමාලාව	CHPB	දින 4	1	20,000.00
61	22.10.2019	SBD පදනම් වූ කොන්ත්‍රාත් කළමනාකරණ ක්‍රියාකාරකම් ආශ්‍රිත ගෙවීම්, විචලනය සහ අවසන් කිරීම	CHPB	දින 1	10	4,000.00
62	24.10.2019	වානේ වහල සැලසුම් කිරීම, විශේෂිත කැටායනය සහ ස්ථාපනය පිළිබඳ හොඳම පුහුණුව	IESL	දින 1	1	නොමිලේ
63	29.10.2019	කොන්ක්‍රීට් සහ වානේ ව්‍යුහය දියුණු පිළිබඳ සම්මන්ත්‍රණය	SSESL	දින 2	1 (M)	6,000.00
					1 (NM)	7,000.00
64	29.10.2019	ජල විගණනය සහ ජල අඩිපාර තක්සේරු කිරීම පිළිබඳ උපදේශක සංවර්ධන පුහුණු වැඩසටහන	ජාතික පිරිසිදු නිෂ්පාදන මධ්‍යස්ථානය	දින 3	1	24,500.00
65	29.10.2019	පලදායී ක්‍රියාවලියක් සඳහා සේවකයා මෙහෙයවන්නේ කෙසේද යන්න පිළිබඳ වැඩමුළුව	CETRAC	දින 1	4	5,000.00
66	05.11.2019	ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් සඳහා ඊළඟට කුමක් කළ යුතුද? යන්න පිලිබඳ සම්මන්ත්‍රණයක්	CCI	පැය 5	1	4,000.00
67	07.11.2019	ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි පිළිබඳ දෙදින වැඩමුළුව	SDFL	දින 2	1	8,500.00
68	19.11.2019	ගොනු කළමනාකරණය, සාමාන්‍ය පරිපාලනය සහ ආයතන සංග්‍රහය	AFS	දින 3		18,000.00
69	25.11.2019	ලේකම් කටයුතු පිළිබඳ සිව් දින වැඩමුළු	SDFL	දින 4		20,000.00
70	27.11.2019	CECB සම්මන්ත්‍රණය 2019	CECB	දින 1		නොමිලේ
උප එකතුව					**279**	**1,107,960.00**
තාක්ෂණික නොවන						
1	04.04.2019	ආරක්ෂිත, විද්‍යාත්මක සහ සකසුරුවම් රිය පදවීම් පිළිබඳ එක් දින වැඩමුළුවක්	CETRAC	දින 1	10	3,250.00
2	17.06.2019	පරිපාලන නිලධාරීන්ගේ යුතුකම් සහ වගකීම්	SDFL	දින 3	4	15,000.00
3	31.08.2019	වාහන ආරක්ෂාව පිළිබඳ එක් දින වැඩමුළුවක්	CETRAC	දින 1	4	5,000.00
4	01.10.2019	විනය ක්‍රියා පටිපාටිය සහ විමර්ශණ පැවැත්වීම පිළිබඳ සම්මන්ත්‍රණය	CNCI	දින 1	2	9,000.00
5	10.10.2019	රියදුරු සහ සුළු සේවකයින් සඳහා ආචාර ධර්ම හා විනය	SDFL	දින 2	2	8,500.00
6	14.10.2019	වරලත් ගණකාධිවරුන්ගේ ජාතික සමුළුව (සජීවී)	CA	දින 2	9	20,000.00
7	14.10.2020	වරලත් ගණකාධිවරුන්ගේ ජාතික සමුළුව (Webcast)	CA	දින 2	1	15,000.00
8	28.10.2019	කාර්යාල සහායකයින්ගේ යුතුකම් සහ වගකීම්	SDPL	දින 2	1	8,500.00
9	30.10.2019	ප්‍රවාහන කළමනාකරණය පිලිබඳ දින දෙකක වැඩමුළුව	SDFL	දින 2	1	8,500.00
උප එකතුව					**34**	**92,750.00**

2019 වර්ෂය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්						
පද්ධති සංවර්ධනයට අදාළ						
අනු අංක	දිනය	පුහුණු වැඩසටහනේ නම	ආයතනය	කාල සීමාව	සහභාගිවන්නන් සංඛ්‍යාව	ඒක පුද්ගල පිරිවැය
1	10.05.2019	ඉදිකිරීම් ආරක්ෂාව සහ වෘත්තීය සෞඛ්‍යය පිළිබඳ ඩිප්ලෝමා (DCSOH)	CIDA	දින 52	1	100,000.00
2	17.10.2019	OHS පිළිබඳ සැසි 34 (OHS තාක්ෂණික සම්මේලනය)	NIOSH	දින 2	2	නොමිලේ
3	21.10.2019	ආරක්ෂ නිලධාරීන් / ඉංජිනේරුවන් සඳහා වන වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	කම්කරු දෙපාර්තමේන්තු	දින 1		නොමිලේ
උප එකතුව					**3**	**100,000.00**
නේවාසික පුහුණුව						
1	27.06.2019	මාර්ග ආරක්ෂණ අධ්‍යාපනය පිළිබඳ ඉදිරිපත් කිරීම්	CECB-CESL	පැය 3		
2	15.05.2019	තිරසාර කාර්ය සාධන කොන්ක්‍රීට් පිළිබඳ ඉදිරිපත් කිරීම	CECB	පැය 2.5		
3	14.05.2019	ප්ලයිවුඩ් ආකෘති නිර්මාණ ලෙස ප්‍රතිස්ථාපනය කිරීම සඳහා PVC තහඩු පිලිබඳ ඉදිරිපත් කිරීම්	CESL	පැය 2.5		
4	21.08.2019	ඉදිකිරීම් කර්මාන්ත සඳහා ෆයිබර් සිමෙන්ති ද්‍රව්‍ය භාවිතය	CECB			
5	27.08.2019	CESL QHSE පද්ධති සහ එය ක්‍රියාත්මක කිරීමේ පද්ධතිය දැනුවත් කිරීම	CESL	දින 3	2	නොමිලේ
6	24.09.2019	CESL QHSE පද්ධති සහ එය ක්‍රියාත්මක කිරීමේ පද්ධතිය දැනුවත් කිරීම	CESL	දින 2	3	නොමිලේ
උප එකතුව					**5**	

07 සේවා අංශ

ගොඩනැගිලි

සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම පදනම මත ගොඩනැගිලි සැලසුම් කිරීම හා ඉදිකිරීම සම්බන්ධයෙන් CESL පෙරමුණ ගෙන සිටී. මෙතෙක් සිදු කර ඇති ඉදිකිරීම් කටයුතු, ගොඩනැගිලි (බහු මහල් ගොඩනැගිලි, කර්මාන්තශාලා ආකාරය, ප්‍රසිද්ධ ගොඩනැගිලි යනාදිය) සිට දිවයින පුරා සමස්ත නගර සංවර්ධනය දක්වා විහිදේ.

මෑතකදී, CESL විසින් පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්වභාවයකින් යුත් ගොඩනැගිලි පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය කිරීම ද සිදු කර ඇත.

CESL බොහෝ දුරට එහි අභ්‍යන්තර විශේෂඥතාව මත රඳා පවතී. කෙසේවෙතත්, විශේෂ අවස්ථාවලදී, CESL සිය ව්‍යාපෘති කණ්ඩායම් ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘතියක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා පිළිගත් ගෘහනිර්මාණ ශිල්පීන් වැනි අදාළ පුද්ගලයින් සම්බන්ධ කර ගනී.

ගොඩනැගිලි වර්ග;

- රෝහල් ගොඩනැගිලි
- වාණිජ ගොඩනැගිලි
- පරිපාලන සහ කාර්යාල ගොඩනැගිලි
- නවාතැන් ගොඩනැගිලි
- විනෝදාත්මක කටයුතු සඳහා යොදාගන්නා
- පර්යන්ත ගොඩනැගිලි
- පොදු ගොඩනැගිලි
- අධිකරණ සංකීර්ණ
- ක්‍රීඩා මණ්ඩප
- බන්ධනාගාර සංකීර්ණ

මාර්ග

CESL සතුව ශ්‍රී ලංකාවේ මාර්ග සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම පිළිබඳ වසර ගණනාවක අත්දැකීම් ඇත. සමාගමේ පොහොසත් අත්දැකීම් අතර;

- මහා මාර්ග, ප්‍රධාන මාර්ග, උස් මාර්ග ආදිය ඉදිකිරීම සහ පවත්නා මාර්ග පුළුල් කිරීම, පුනරුත්ථාපනය කිරීම, වැඩිදියුණු කිරීම සහ නැවත සකස් කිරීම.
- ආරක්ෂක ආරක්ෂක පිලි, මාර්ග, ගෘහ භාණ්ඩ ආදිය සැකසීම.

වාරිමාර්ග ව්‍යුහ

වාරිමාර්ග ක්ෂේත්‍රයේ CESL හි ඉංජිනේරු විශේෂඥතාව පහත සඳහන් දෑ ඇතුළුව මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති නිර්මාණය කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාවට නැංවීම සහ ක්‍රියාත්මක කිරීම දක්වා විහිදේ;

- වර්ධනය කිරීම
- ජලාශ පුනරුත්ථාපනය කිරීම සහ ඉදිකිරීම
- ඇළ මාර්ග
- අමුණු
- පස් වේලි
- නියාමන ව්‍යුහ
- වේලි
- හයිඩ්‍රොලික් ව්‍යුහ

පාලම් සහ බෝක්කු

CESL හට දිවයිනේ පාලම් සහ බෝක්කු සැලසුම් කිරීම හා ඉදිකිරීම පිළිබඳ පුළුල් අත්දැකීම් ඇත.

වසර ගණනාවක් පුරා CESL පහත සඳහන් දෑ සැලසුම් කිරීම, ඉදිකිරීම සහ ස්ථාපනය කිරීමෙහි ඉහළ කීර්තියක් ලබා ඇත;

- කොන්ක්‍රීට් සහ වානේ ගුවන් පාලම්
- කොන්ක්‍රීට්, වානේ සහ සංයුක්ත පාලම්
- පදික පාලම්, මාර්ගය හරහා ඉහළින් පිහිටන පාලම්
- පවත්නා පාලම් පුනරුත්ථාපනය හා ශක්තිමත් කිරීම
- බෝක්කු, මාර්ගය දෙපස කාණු සහ ජලය බැස යන කාණු වැනි ජලාපවහන ව්‍යුහ

වෙනත් විශේෂ පහසුකම්

පහත සඳහන් වන වෙනත් අංශවල විශේෂ පහසුකම් සැලසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ඉදිකිරීම සඳහා CESL දායක වී ඇත;

- සත්වෝද්‍යාන සහ සඟාරි උද්‍යාන සංවර්ධනය කිරීම
- ජෛවවිවිධත්ව උද්‍යාන
- ක්‍රීඩාංගන
- මලාපවහන හා ජල පවිත්‍රාගාර

08 ව්‍යාපාර මෙහෙයුම් සමාලෝචනය

පොලොන්නරුව කෞතුකාගාර හා සම්පත් මධ්‍යස්ථානය

- සේවාදායකයා: - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පොලොන්නරුව
- කොන්ත්‍රාත් මුදල: - රු. මිලියන 597
- ආරම්භ කළ දිනය: - 04.08.2016
- සම්පූර්ණ කළ දිනය:- 30.06.2019







කළුතර පොදු වෙළඳපොල

- සේවාදායකයා: - නාගරික හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
- කොන්ත්‍රාත් මුදල: - රු. මිලියන 225
- ආරම්භ කළ දිනය: -
- සම්පූර්ණ කළ දිනය: - 01.2019











කඩුරුවෙල නගර දුම්රිය නිල නිවාසය

- සේවාදායකයා: - නාගරික සංවර්ධන අධිකාරිය
- කොන්ත්‍රාත් මුදල: - රු. මිලියන 270
- ආරම්භ කළ දිනය: - 02.01.2017
- සම්පූර්ණ කළ දිනය: - 04.2019















හිඟුරක්ගොඩ ආනන්ද බාලිකා පාසල සඳහා පිහිනුම් තටාකය සහ මණ්ඩප

- සේවාදායකයා: - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පොලොන්නරුව
- කොන්ත්‍රාත් මුදල: - රු. මිලියන 48.4
- ආරම්භ කළ දිනය: - 12.12.2016
- සම්පූර්ණ කළ දිනය: - 25.03.2019







පොලොන්නරුවේ නව නගර හි මහ නගර සභා ගොඩනැගිල්ල

- සේවාදායකයා: - නාගරික සංවර්ධන අධිකාරිය
- කොන්ත්‍රාත් මුදල: - රු. මිලියන 147
- ආරම්භ කළ දිනය: - 22.02.2017
- සම්පූර්ණ කළ දිනය: - 10.04.2019

















09 මූල්‍ය ප්‍රකාශන

- ස්වාධීන විගණකවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CEN/B/CESL/09/FA/2019/04 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 31 August 2020

The Chairman
Central Engineering Services (Private) Limited

Report of the Auditor General on the Financial Statements and Other Legal Regulatory Requirements of the Central Engineering Services (Private) Limited for the year ended 31 December 2019 in terms of Section 12 of the National Audit Act, No. 19 of 2018.

The English version of the above mentioned report together with audited financial statements for the year ended 31 December 2019 is sent herewith.

W.P.C. Wickramaratne
Auditor General

Copies to: 1. The Secretary, Ministry of Finance
2. The Secretary, Ministry of Irrigation

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. CEN/B/CESL/09/FA/2019/04 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 31 August 2020

සභාපති
සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (පුද්ගලික) සමාගම

සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (පුද්ගලික) සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. මතය

සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 2 - තොග:** වර්ෂය අවසානයේදී භෞතික තොග ගණනය කිරීම නිරීක්ෂණය කිරීමට නොහැකි වීම හා නිසි තොග සත්‍යාපන වාර්තාවක් හෝ කිසිදු ස්වාධීන සහතිකයක් හෝ නොමැතිවීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට පැවති රු.727,114,715 ක් වටිනා අතැති තොගයෙහි පැවැත්ම සහතික කිරීම සඳහා වන විකල්ප ක්‍රම පිළිඹඳව සෑහීමකට පත් වීමටද නොහැකි විය.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

(ආ)**ශ්‍රී.ලං.ගි.ප්‍ර. 16 - දේපළ, පිරියන සහ උපකරණ:** දළ වශයෙන් රු. 639,329,113 ක පිරිවැයක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ගිණුම්කරණ ප්‍රමිතයේ 51 ක් වන වගන්තිය ප්‍රකාරව ඒවායේ ඵලදායි ආර්ථික ආයු කාලය නැවත ඇගයීම් කර, ඒ අනුව ගිණුම්ගත කිරීමකින් තොරව සමාගම විසින් ඒවා අඛණ්ඩව භාවිතයට ගනිමින් තිබුණි.

(ඇ) වෙළඳ ණයගැති ශේෂය තුල ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් (කාර්යංශය) ලැබිය යුතු ලෙස රු. 110,084,729 ක මුදලක් ඇතුලත් වී තිබූ නමුත් මෙම මුදල සමාගමට ගෙවිය යුතු මුදලක් ලෙස කාර්යංශයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර නොතිබුණි.

මීට අමතරව, සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙන් ලැබිය යුතු ණයගැති ශේෂය ලෙස රු. 513.455.828 ක මුදලක් පෙන්නුම් කර තිබුනු අතර කාර්යංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 382,181,782 ක් ලෙස පෙන්නුම් කර තිබූ බැවින් මෙම ශේෂයන් දෙක අතර රු. 131,274,046 ක වෙනසක් දක්නට තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණයේ දක්වා තිබූ රු. 15,175,926 ක් වටිනා බදුකර දේපළ සම්බන්ධයෙන් සමාගම හා නාගරික සංවර්ධන අධිකාරිය අතර එළඹූ ගිවිසුම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එබැවින් බදුකර දේපළෙහි නිරවද්‍යභාවය විගණනයේදී ඇගයීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (1) (ඇ) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ***පහත සඳහන් නිරීක්ෂණ හැර*** යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**විස්තරය**
(අ) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
2015 ජූලි 14 දිනැති අංක 3/ 2015 දරණ රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 සහ සමාගමේ මුල්‍ය බලතල බෙදා දීම.	ලබා දුන් අත්තිකාරම් (උප අග්‍රිම) ඒවා ලබා දුන් අරමුණු ඉටුවූ විගස නිරවුල් කළ යුතුය. කෙසේවුවද සමාගමේ මූලික කාර්යාලය විසින් විවිධ පාර්ශවයන් වෙත සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂවලදී ලබා දුන් රු.93,263,606 ක් වූ අත්තිකාරම් 2020 අගෝස්තු 15 වන දින වන විටත් නිරවුල් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයේදී වසර 03 කට හා 05 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබූ පිළිවෙලින් රු.1,847,631 සහ රු.1,266,401 ක අත්තිකාරම් පැවතුණි.
(ආ) යහ පාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති හා අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය.	
(i) 4.2.5 ඡේදය	සෙමින් වලනය වන හා භාවිතයට ගත නොහැකි තොග හඳුනා ගනිමින් එම තොග පිළිඹඳ කාල විශ්ලේෂණය මාසික පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර නොතිබුණි.

	(ii) 8.8 ඡේදය	වියදම් සීමා ඇතුලත්ව අධිකාරි බලය බෙදා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු අතර එවැනි අධිකාරි බලය බෙදා දීමේ සීමාවන්ට පරිභාහිරව කිසිදු වියදමක් දැරීම හෝ බලය දීමක් සිදු නොකල යුතුයි. තවද එවැනි බලය බෙදා දීමක් සෑම වර්ෂයක්ම ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යාවත්කාලීන කර අනුමත කළ යුතුයි. කෙසේවුවද එවැනි ක්‍රමවේදයන් සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.
	(iii) 9.3.1 ඡේදය	2020 ජූනි 30 දින වන විට සමාගම විසින් ස්ථිර (Fixed), ස්ථිර කොන්ත්‍රාත් පදනම (Fixed term contract), රැකියා කොන්ත්‍රාත් (Job contract) සහ පැවරුම් පදනම (Assignment basis) යටතේ විවිධ තනතුරු සඳහා නිලධාරීන් 792 දෙනෙකු බඳවා ගෙන තිබුණි.
(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2006 හී 4.2 මාර්ගෝපදේශය	සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ඇතුලත්ව අවම වශයෙන් අවුරුදු තුනක කාල පරිච්ඡේදය වෙනුවෙන් පුරෝකථණය කළ ප්‍රසම්පාදන කාර්යයන් සඳහා වන ප්‍රධානා ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල උප ලේඛණයක් සමාගම විසින් විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණි.
(ඈ)	අංක 30/2016 දරණ හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වගන්තිය	සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 ක කාලයකට පසුව හෝ කි.මී. 25,000 ක දුර ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමේ විශාල අළුත්වැඩියාවක් කිරීමෙන් පසුව හෝ යන සිද්ධීන් වලින් ප්‍රථමයෙන් සිදුවන සිද්ධියකදී ඉන්ධන පරිහරන පිළිඹඳ පරීක්ෂා නැවත වරක් සිදු කළ යුතුය. එසේවුවද සමාගම සතු වාහන 89 ක් සම්බන්ධයෙන් මෙම ක්‍රියාවලිය සිදු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ***පහත සඳහන් නිරීක්ෂණය හැර*** සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

  - මධ්‍යගත කරන ලද ප්‍රසම්පාදන ක්‍රමයක් නොමැතිවීම හේතුවෙන්, අදාල බලයලත් පාර්ශව සමඟ සම්බන්ධවී ආර්ථිකභාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුක්තව, කාල පරිච්ඡේදය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය නිශ්චය කිරීමෙන් පසුව නිසි සැපයුම්කරුවන් තෝරා ගනිමින් තොග වශයෙන් සිමෙන්ති, වැලි, වානේ, ගඩොල්, තීන්ත යනාදී ඉදිකරීම් ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම වෙනුවට සමාගමේ මූලික කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 4,306,101,476 ක ඉදිකිරීම් ද්‍රව්‍ය වරින් වර නොයකුත් සැපයුම්කරුවන්ගෙන් විවිධ මිල ගණන් යටතේ ප්‍රසම්පාදනය කර තිබුණි.

3. අනෙකුත් ප්‍රධාන විගණන නිරීක්ෂණ

(අ) සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව 2019 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන බැරකම් යටතේ රු. 1,600,196,675 ක මුදලක් සම්බන්ධිත සමාගමට (Due to related companies) ගෙවිය යුතු ශේෂ ලෙස පෙන්නුම් කර තිබුනු අතර 2018 දෙසැම්බර් 31 දිනට මෙම ශේෂය රු. 1,588,871,721 ක් ලෙස පෙන්වා තිබුණි. කෙසේවුවද මෙම ශේෂ නිරවුල් නොකර ක්‍රමානුකූලව වසරින් වසර වැඩි වෙමින් ගොස් තිබුනි. තවද එම මුදලින් රු. 722,491,190 ක මුදලක් හෝ සියයට 45 ක් අවුරුදු 05 කට වැඩි කාලයක් තිස්සේ වෙනස් නොවී පැවතුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 4,151,195,129 ක් වූ ණයගැති ශේෂයෙන් රු. 363,966,179 ක ණයගැතියන් අවුරුදු 03 කට වැඩි කාලයක් හිඟහිටව තිබූ අතර එම ණයගැති ශේෂයෙන් එකතුව රු.110,359,922 ක මුදලක් අවුරුදු 05 කට වැඩි කාලයක් අය කර ගැනීමකින් තොරව පැවතුනි. ඒ අතරතුර නිම කරන ලද ව්‍යාපෘති වලට අදාල එකතුව රු. 405,740,472 ක ණයගැති ශේෂයක් 2019 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුනි.

(ඇ) සමාගම විසින් සිදු කරන ලද ව්‍යාපෘති අවසන් වීමෙන් පසු, ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු (Due from customers) හෝ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතුය. (Due to customers) මුදල් ශේෂ නොතිබිය යුතුය. කෙසේවෙතත් නිම කරන ලද ව්‍යාපෘතිවලට අදාල ගිණුම් ශේෂ ඉවත් කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග නොගෙන එවැනි ව්‍යාපෘතීන් 39 කට අදාලව රු.106,719,232 ක් හා රු.65,850,320 ක්වූ ශේෂ පිළිවෙලින් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු (Due from customers) හා ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතුය ශේෂ ලෙස ගිණුම්වල දක්වා තිබුනි.

(ඇ) මූලික කාර්යාල 07 ක සම්පූර්ණයෙන් නිම කරන ලද හා සියයට 90 කට වඩා වැඩියෙන්, නිම කරන ලද ව්‍යාපෘති වලට අදාලව ලැබී තිබූ පිළිවෙලින් රු.22,183,953 ක් සහ රු.77,147,582 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමකින් තොරව ගිණුම් වල රඳවා ගෙන තිබුණි. තවද මෙම මුදල් පියවීමට හෝ සමාගමේ ආදායමට ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුනි.

(ඉ) විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ කාල විශ්ලේෂණයට අනුව, ලැබිය යුතු රඳවා ගැනීම්, ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, ආපසු ලැබිය යුතු තැන්පතු, අනෙකුත් අත්තිකාරම් හා පෙර ගෙවුම් යනාදී එකතුව රු. 296,863,647 ක් සහ රු. 154,860,693 ක් වූ ලැබිය යුතු ගිණුම් 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් වර්ෂ 03 කට සහ වර්ෂ 05 කට වැඩි කාලයක් නිහඉිටිව පැවතුණි. එසේ වුවද සමාගමේ වගකිවයුතු නිලධාරීන් මෙම දීර්ඝකාලීන නිහඉිට ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුනි. තවද මෙම දීර්ඝකාලීන නිහඉට ශේෂ මත සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු හානිකරණයක් කර නොතිබුණි.

(ඊ) 2019 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් සහ ගෙවිය යුතු රඳවාගැනීම් පිළිවෙලින් රු.2,591,988,113ක් හා රු.569,162,641ක් විය. මෙම ශේෂයන් අතරින් එකතුව රු.185,990,335 ක් සහ රු. 40,617,741 ක් වූ මුදල් පිළිවෙලින් අවුරුදු 03කට හා 05 කට වැඩි කාලයක් නොපියවා පැවතුණි. විස්තර පහත දැක්වේ.

අයිතම	මූල්‍ය ප්‍රකාශණ වල ඇතුලත් මුදල	අවුරුදු 3 ට වැඩි	අවුරුදු 5ට වැඩ
	රු.	රු.	රු.
ණයහිමියන්	2,591,988,113	143,461,829	38,038,182
ගෙවිය යුතු රඳවුම්	569,162,641	42,528,506	2,579,559
එකතුව		185,990,335	40,617,741

(උ) සැළකිය යුතු අලාභයක් සහිතව නිම කරන ලද ව්‍යාපෘති

විගණනය සඳහා ලබා දී තිබූ තොරතුරු වලට අනුව, ලංසු තැබීමේ ක්‍රියාපටිපාටි හා ක්‍රියාත්මක කිරීමේ අකාර්යක්ෂමතා හේතුවෙන් සමාගමේ මූලික කාර්යාල දහයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබූ නිම කල ඉදිකිරීම් ව්‍යාපෘති 152 කින් සමාලෝචිත වර්ෂයේදී රු.722,817,538 ක අලාභයක් ලබා තිබුනු අතර පසුගිය වර්ෂයේ එම අලාභය රු.724,162,239 ක් විය. මීට අමතරව සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක වෙමින් පැවති තවත් ව්‍යාපෘති 21 කින් රු.196,680,925 ක අලාභයක් වාර්තා විය. විස්තර පහත දැක්වේ.

මූලික කාර්යාලයේ නම	ව්‍යාපෘති සංඛ්‍යාව	කොන්ත්‍රාත් මුදල	සමුච්චිත පිරිවැය	ව්‍යාපෘති අලාභය
		රු.	රු.	රු.
දකුණු නැඟෙනහිර	06	414,638,838	460,514,494	45,875,657
WP2	08	125,047,417	138,748,465	13,701,048
WP1	04	85,894,631	92,022,191	6,127,560
මධ්‍යම	06	388,298,914	418,047,309	22,132,736
උතුර	01	367,447,715	397,143,964	29,696,248
සබරගමුව	01	26,760,099	28,593,109	1,833,010
දකුණ	15	1,466,063,097	1,635,353,884	169,290,788
ඌව	2	46,894,391	55,403,473	8,509,082
උතුරු මැද	72	2,524,795,872	2,840,067,371	315,271,499
MKDP	35	1,344,450,964	1,454,830,873	110,379,909
	152	**6,790,291,938**	**7,520,725,133**	**722,817,538**

ඉහත නිම කරන ලද ව්‍යාපෘති 152 කින්, සියයට 43 ක්ම සමාගමේ උතුරු මැද (අනුරාධපුර) මූලික කාර්යාලයට අයත් වූ නිම කරන ලද ව්‍යාපෘතින් වන අතර පසුගිය වර්ෂයේ මෙම මූලික කාර්යාලය විසින් ලද රු. මිලියන 255 ක පාඩුවට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘති වලින් රු. මිලියන 315 ක පාඩුවක් දරා තිබුනි.

(ඌ) අලාභපිට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

මූලික කාර්යාලයේ නම	ව්‍යාපෘති සංඛ්‍යාව	කොන්ත්‍රාත් මුදල	සමුච්චිත පිරිවැය 2019.12.31 දිනට	ව්‍යාපෘති අලාභය	නිම කරන ලද ප්‍රමාණය
		රු.	රු.	රු.	%
දකුණු නැඟෙනහිර	03	201,342,919	214, 728,226	13,385,307	94 - 97
WP2	04	1,366,914,754	1,465,868,668	98,653,914	99
මධ්‍යම	09	239,816,673	286,651,820	46,835,147	97 - 99

සබරගමුව	02	423,798,796	458,864,427	35,065,631	97 - 98
ඌව	01	36,756,820	36,874,916	118,096	89
උතුරු මැද	02	10,601,020	12,923,850	2,322,830	99
එකතුව	**21**	**2,279,230,982**	**2,475,911,907**	**196,680,925**	

ඉහත පාඩුමත කෙරීගෙන යන ව්‍යාපෘති අතරෙන්, ව්‍යාපෘති 04 ක් සමාගමේ බස්නාහිර පළාත් මූලික කාර්යාල 2 (WP2) විසින් රු. මිලියන 98 ක පාඩු සහිතව 2019 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කරමින් පැවතුනි.

(එ) සමාගම කෙටිකාලීන ආයෝජන මාර්ගවල ආයෝජනය කර එම ආයෝජන වලින් රු.191,743,215 ක පොළී ආදායමක් සමාලෝචිත වර්ෂයේදී උපයා ගෙන තිබුණි. මෙම ආදායම සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභයෙන් සියයට 93 ක් නියෝජනය කර තිබුනි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී ඇස්ෆල්ට් (Asphalt) නිෂ්පාදනය කිරීම හා විකිනීම යටතේ සමාගමේ බදුල්ල මූලික කාර්යාලය විසින් රු. 11,443,725 ක අලාභයක් අත්පත් කරගෙන තිබුණි.

(ඔ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 9.7 වගන්තියට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සමාගමේ සේවකයින් සඳහා එකතුව රු.මිලියන 100.43 ක රඳවා ගැනීමේ දීමනාව සහ වෛද්‍ය දීමනා වැනි කාර්ය මණ්ඩල දීමනා සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුනි.

(ඕ) බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් නැතිව, මූලික වැටුපෙන් සියයට 25 ක පැමිණීම මත වූ දිරි දීමනාවක් 2014 සිට සමාගමේ කාර්ය මණ්ඩලයට ගෙවා තිබුනි. තවද සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 83.68 ක මුදලක් එම දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන	CESL 2019 රු.	CESL 2018 රු.
ආදායම	**5**	10,474,714,291	11,189,114,164
විකුණුම් පිරිවැය	**6**	(9,693,387,587)	(10,402,779,545)
දළ ලාභය		**781,326,705**	**786,334,619**
වෙනත් ආදායම	**7**	106,030,139	104,250,107
පරිපාලන වියදම්		(827,817,283)	(820,866,054)
විකුණුම් සහ බෙදාහැරීමේ වියදම්		(3,990,666)	(2,561,757)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබීම්		**55,548,895**	**67,156,915**
මූල්‍ය ආදායම		191,743,215	150,173,742
මූල්‍ය පිරිවැය		(40,440,063)	(44,240,151)
ශුද්ධ මූල්‍ය ආදායම	**8**	**151,303,152**	**105,933,591**
ආදායම් බදු පෙර ලාභය		**206,852,047**	**173,090,507**
බදු වියදම	**9**	(65,386,381)	(51,637,703)
වර්ෂය සඳහා ලාභය/(අලාභය)		**141,465,667**	**121,452,804**
වෙනත් විස්තීර්ණ ආදායම			
අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම්වල ආයුගණක ලාභය/(අලාභය)	**17.(d)**	(359,907)	(683,106)
වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම්		**(359,907)**	**(683,106)**
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**141,105,760**	**120,769,698**

වරහන් තුළ ඇති අගයන්වලින් අඩු කිරීම් පිළිබිඹු වේ.

37 සිට 66 දක්වා පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අභ්‍යන්තර කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		CESL	
	සටහන	2019 රු.	2018 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ	10	426,357,095	408,908,598
කල්බදු දේපල	11	15,175,926	-
සිදු කෙරෙමින් පවතින කාර්යයන් - ප්‍රාග්ධන වත්කම්	12	31,636,836	26,306,616
දීර්ඝ කාලීන ආයෝජන	13	-	-
මුළු ජංගම නොවන වත්කම්		**473,169,857**	**435,215,214**
ජංගම වත්කම්			
බඩු වට්ටෝරු	14	727,114,716	745,304,435
සිදු කෙරෙමින් පවතින කාර්යයන්	15	79,938,521	458,346,685
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	16	9,329,578,897	8,664,563,679
කෙටි කාලීන ආයෝජන	13	1,759,981,590	1,985,105,933
මුදල් හා මුදල් හා සමාන දෑ	17	311,248,129	328,064,834
මුළු ජංගම වත්කම්		**12,207,861,853**	**12,181,385,566**
මුළු වත්කම්		**12,681,031,711**	**12,616,600,780**
සමකොටස් සහ බැරකම්			
දායක ප්‍රාග්ධනය		10,000,020	10,000,020
රඳවාගත් ඉපයීම්		594,865,473	411,113,142
		604,865,493	**421,113,162**
ජංගම නොවන බැරකම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම	18	13,071,063	8,527,850
විලම්භිත බදු	19	41,765,625	32,162,145
සම්බන්ධිත සමාගම්වලින් ලැබිය යුතු මුදල්		1,600,196,675	1,588,871,721
මුළු ජංගම නොවන බැරකම්		**1,655,033,363**	**1,629,561,715**
ජංගම බැරකම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	20	10,411,524,816	10,487,491,867
ගෙවිය යුතු ආදායම් බදු	21	9,608,038	48,014,357
අන්තර් කාර්යාල ජංගම ගිණුම්		-	-
බැංකු අයිරා	17	-	30,419,679
මුළු ජංගම බැරකම්		**10,421,132,854**	**10,565,925,903**
මුළු සමකොටස් සහ බැරකම්		**12,681,031,711**	**12,616,600,780**

වරහන් තුළ ඇති අගයන්වලින් අඩු කිරීම් පිළිබිඹු වේ.

37 සිට 66 දක්වා පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අභ්‍යන්තර කොටසකි.

පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බවට සහතික කර ඇත.



ජේ. එම්. බී. ජයවීර
ප්‍රධාන මූල්‍ය නිලධාරී



ඉංජී. එල්. ඩබ්ලිව්. ජේ. එන්. ද අල්විස්
ප්‍රධාන විධායක නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා සහ වෙනුවෙන් අනුමත කර අත්සන් කර ඇත.



ඉංජී. යූ. එස්. කරුණාරත්න
සභාපති



ඉංජී. ජී. ආර්. ඒ.එස්. ගුණතිලක
අධ්‍යක්ෂ

2020 පෙබරවාරි 28

	CESL		
	දායක ප්‍රාග්ධනය රු.	ප්‍රාග්ධන සංචිතය රු.	රඳවාගත් ඉපැයුම් රු.
2018 ජනවාරි 01 දිනට ශේෂය	-	-	290,343,444
පෙර වර්ෂයේ ගැලපීම්	10,000,020		121,452,804
වර්ෂය සඳහා ලාභය	-	-	
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	(683,106)
	10,000,020	**-**	**411,113,142**
			-
2019 ජනවාරි 01 දිනට පෙර ශේෂය පෙර	10,000,020	-	411,113,142
වර්ෂයේ ගැලපීම් - සටහන - I පෙර			20,191,994
වර්ෂයේ ගැලපීම් - සටහන - II පෙර			22,454,577
වර්ෂය සඳහා ලාභය	-	-	141,465,667
වෙනත් විස්තීර්ණ ආදායම	-	-	(359,907)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,000,020**	-	**594,865,473**

වරහන් තුළ ඇති අගයන්වලින් අඩු කිරීම් පිළිබිඹු වේ.

37 සිට 66 දක්වා පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අභ්‍යන්තර කොටසකි.

<u>සටහන - I</u>

ක්ෂයවීම් අනුපාතවල දෝෂය LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ දෝෂ අනුව සකස් කරන ලදී.

<u>සටහන - II</u>

පෙර වර්ෂයේ ආදායම් බදු වගකීම් වෙනස්වීම් රඳවා ගත් ඉපැයීම් සඳහා ගැලපීම් සිදුකරන කරන ලදී.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	CESL	
	2019 රු.	2018 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින මූල්‍ය ප්‍රවාහය		
බදු පෙර ලාභය	**206,852,047**	173,090,507.00
ගැලපීම් :		
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ ක්‍රමක්ෂය	157,733,292	165,689,241.00
පෙර වර්ෂයේ ගැලපීම්		(122,605,569.00)
කපා හල වත්කම්	-	-
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	5,309,189	4,381,276.00
නොපියවූ ණය සඳහා ප්‍රතිපාදන		-
දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීම් මත ලාභය	(152,886)	-
අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභය/(අලාභය)	(359,907)	(683,106.00)
ශුද්ධ මූල්‍ය ආදායම	(151,303,152)	(105,933,591.00)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභය	**218,078,583**	**113,938,758**
බඩු වට්ටෝරුවල (වැඩිවීම)/අඩුවීම	18,189,719	76,906,269
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම	(665,015,219)	1,037,508,247
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑවල (වැඩිවීම)/අඩුවීම	(75,967,051)	195,519,506
සම්බන්ධිත සමාගම්වලින් ලැබීමට ඇති දෑවල (වැඩිවීම)/අඩුවීම	11,324,955	23,249,981
සිදු කරමින් පවතින කාර්යයන්වල (වැඩිවීම)/අඩුවීම	378,408,164	(458,346,685)
පොදු අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වැඩිවීම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය කරන ලද මුදල්	**(114,980,849)**	**988,776,076**
ගෙවූ පොලී	(40,440,063)	(44,240,151)
ගෙවූ බදු ගෙවූ	(71,734,642)	(31,544,740)
පාරිතෝෂික	(765,976)	(431,430)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**(227,921,530)**	**912,559,755**

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	CESL	
	2019 රු.	2018 රු.
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ		
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ අත් පත් කර ගැනීම	(140,475,237)	(119,879,460)
සිදු කරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්වල ආයෝජන	(5,330,220)	(1,033,240)
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලැබෙන ආදායම	814,256	
පරිපාලිත අත්පත් කර ගැනීම	-	
කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කිරීම	225,124,344	(874,034,908)
දිගුකාලීන ආයෝජනයවල ආයෝජනය කිරීම	-	-
ලාභාංශ ආදායම	-	-
පොලී ආදායම	191,743,215	150,173,742
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**271,876,358**	**(172,186,711)**
මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ		
සමකොටස් නිකුත් කිරීමෙන් ලද ආදායම	-	-
ගෙවූ ලාභාංශ	-	-
ණය ආපසු ගෙවීම	-	-
මූල්‍ය කල්බදු බැරකම් ගෙවීම	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්	**-**	**-**
මුදල් හා මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	43,954,828	67,785,889
ආරම්භයේදී මුදල් හා මුදල් හා සමාන දෑ	297,645,155	229,859,266
අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ	**311,248,129**	**297,645,155**

වරහන් තුළ ඇති අගයන්වලින් අඩු කිරීම් පිළිබිඹු වේ.

37 සිට 66 දක්වා පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අභ්‍යන්තර කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

1. සංයුක්ත තොරතුරු

1.1. සාමාන්‍ය තොරතුරු

සෙන්ට්‍රල් ඉන්ජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ('සමාගම') ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ස්ථාපිත කර ඇති පුද්ගලික සීමිත වගකීම් සමාගමකි. අංක 415, බෞද්ධලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව යන ස්ථානයේ සමාගමේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත.

සෙන්ට්‍රල් ඉන්ජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2003 වර්ෂයේ දෙසැම්බර් 16 වැනි දින සංස්ථාගත කරන ලද අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2009 නොවැම්බර් 6 වන දින නැවත ලියාපදිංචි කර ඇත. කෙසේවෙතත්, සමාගම සිය මෙහෙයුම් ආරම්භ කර ඇත්තේ 2011 වර්ෂයේදී වන අතර එම වසරට පෙර මෙහෙයුම් සිදු නොවීය.

1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ඕනෑම ආකාරයක ඉංජිනේරු හෝ ඉංජිනේරු ආශ්‍රිත ක්‍රියාකාරකම් හා සම්බන්ධ ඉදිකිරීම් ව්‍යාපෘති භාර ගැනීම, සිදු කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම යන ව්‍යාපාරවල සමාගම නිරතව සිටී

1.3. ප්‍රධාන කාර්යාලය

අංක. 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

1.4. සමාගම් ලේකම්

පී.අයි. අබේගුණවර්ධන මිය
අංක. 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

1.5. බැංකුකරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව

1.6. සැලකිය යුතු කොටස් හිමිකම්

වර්ෂය අවසානයේ සමාගමේ එකම කොටස් හිමියා පහත පරිදි වේ:

කොටස් හිමියන්	කොටස් සංඛ්‍යාව	එක් කොටසක වටිනාකම (රු.)	මුළු වටිනාකම (රු.)	රඳවා ගැනීමේ ප්‍රතිශතය
ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය	100,000	100	10,000,000	100%
	2	10	20	

2. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, ඉදිරිපත් කරන ලද සියලුම වසර සඳහා මෙම ප්‍රතිපත්ති නිත්‍ය වශයෙන් අදාළ වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.1. සකස් කිරීමේ පදනම

2.1.1. අනුකූලවීමේ ප්‍රකාශනය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීර්ණ ආදායම්, සමකොටස් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් නියම කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRSs / LKASs) සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

2.1.2. මූල්‍ය ප්‍රකාශනවල සංරචක

මූල්‍ය ප්‍රකාශනවල පහත සඳහන් අංග ඇතුළත් වේ:

අ) ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය: වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ලබා දීම.

ආ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය: වර්ෂය අවසානයේදී සමූහයේ සහ සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ලබා දීම.

ඇ) සමකොටස් වෙනස්වීම් ප්‍රකාශනය: සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සමූහයේ සහ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිතවල චලනයන් පිළිබඳ තොරතුරු ලබා දීම.

ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය: මුදල් හා මුදල් හා සමාන දෑ උත්පාදනය කිරීම හා ඒවා භාවිතා කිරීම පිළිබඳ තොරතුරු ලබා දීම.

ඉ) මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්: ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන් අඩංගු වේ.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2020 පෙබරවාරි 28 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දී ඇත.

2.1.3. මූල්‍යප්‍රකාශන සඳහා වගකීම

2007 අංක 07 දරන සමාගම් පනතේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (SLFRSs / LKASs) විධිවිධාන ප්‍රකාරව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමකි.

2.1.4. මූල්‍ය වර්ෂය

සමාගමේ මූල්‍ය කාලය 2019 ජනවාරි 1 සිට 2019 දෙසැම්බර් 31 දක්වා මාස දොළහක කාලයකින් සමන්විත වේ.

2.1.5. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අයිතම මනිනු ලබන්නේ ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් භාවිතා කරමිනි. සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් (රු.) ඉදිරිපත් කර ඇති අතර එය සමාගමේ ක්‍රියාකාරී මුදල් වර්ගය වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.1.6. ඇගයීමේ පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පහත සඳහන් අයිතම හැර මූල්‍ය ප්‍රකාශයන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත:

අ) සාධාරණ වටිනාකමට අගයන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් - LKAS 39
ආ) ආයුගණක තක්සේරුව මත පදනම්ව හඳුනාගත් සේවක ප්‍රතිලාභ බැරකම - LKAS 19
ඇ) බඩු තොග ඒවායේ වර්තමාන වටිනාකමට ගෙන යනු ලැබේ - LKAS 2

2.1.7. සංසන්දනාත්මක තොරතුරු

ප්‍රමාණාත්මක, ආඛ්‍යාන හා අදාළව වන පරිදි විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල පෙර කාලයට අදාළව අනාවරණය වේ. වඩා හොඳ ඉදිරිපත් කිරීමකට සඳහා සහ වත්මන් වර්ෂයේ ඒවා සමඟ සැසඳිය හැකි වන පරිදි පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංශෝධනය කරනු ලැබේ.

2.1.8. වැටයීම

වෙනත් ආකාරයකින් දක්වා ඇති විට හැර ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු, ආසන්න රුපියලට (රු.) වටයා ඇත.

2.1.9. හිලව් කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අවශ්‍යතාවයක් හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් හිලව් කරනු නොලැබේ.

2.1.10. ද්‍රව්‍යමයභාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම ද්‍රව්‍ය පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. වැදගත් නොවන්නේ නම්, නොගැලපෙන ස්වභාවයක් හෝ ක්‍රියාකාරිත්වක් සහිත අයිතම වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.1.11. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් සහ ඒ සමඟ ඇති අනාවරණයන් සහ අනිශ්චිත වගකීම් අනාවරණය කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන කළමනාකරණය විසින් සිදු කළ යුතු වේ. මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවයේ ප්‍රතිඵලයක් ලෙස අනාගත කාල පරිච්ඡේදයන් තුළ බලපෑමට ලක්වූ වත්කම් හෝ බැරකම්වල ඉදිරියට ගෙන යෑමේ වටිනාකම සඳහා ද්‍රව්‍යමය ගැලපීමක් අවශ්‍ය වේ.

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් හා බැරකම්වල පවතින වටිනාකමේ ප්‍රමාණයට ද්‍රව්‍යමය ගැලපීමක් සිදු කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, වාර්තාකරණ දිනයට අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පන සහ අවිනිශ්චිතතාවය තක්සේරු කිරීමේ අනෙකුත් ප්‍රධාන ප්‍රභවයන්ද පහත අදාළ මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධිත අයිතමයන්හි තනි සටහන්වල විස්තර කර ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ලබා ගත හැකි පරාමිතීන් මත සමාගම සිය උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කර ගෙන ඇත. කෙසේවෙතත්, වෙළඳපල වෙනස්වීම් හෝ සමාගමේ පාලනයෙන් ඔබ්බට ඇති තත්ත්වයන් හේතුවෙන් අනාගත ප්‍රවණතා පිළිබඳ පවත්නා තත්ත්වයන් සහ උපකල්පන වෙනස් විය හැකිය. එවැනි වෙනස්කම් සිදු වූ විට, ඒවා උපකල්පනවලින් පිළිබිඹු වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.1.11. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන (ඉදිරියට.)

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කර ඇති අතර පහත සඳහන් අයිතමයන් කළමනාකරණය විසින් සලකා බලන ලදී:

අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර ප්‍රත්‍යාසන්න අනාගතය සඳහා ව්‍යාපාර සිදු කරගෙන යෑමට සම්පත් ප්‍රමාණවත්ව පවතින බවට සෑහීමට පත් වී ඇත. තවද, අඛණ්ඩව පැවතීම සඳහා සමූහයේ/සමාගමේ හැකියාව සම්බන්ධයෙන් සැකයක් ඇති කළ හැකි තරමේ සැලකිය යුතු අවිනිශ්චිතා පිළිබඳ කළමනාකාරිත්වය දැනුවත් වී නොමැත. එබැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනමින් සකස් කිරීම සිදු කරගෙන යනු ලැබේ.

හඳුනාගත් ප්‍රමාණය මත බලපෑමක් සහිත සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට සැළකිය යුතු ගැලපුමක ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය යුතු අවදානමක් සහිත විනිශ්චයන්, උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයන් පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන්වලට ඇතුළත් වේ:

අ) අර්ථ දැක්වූ ප්‍රතිලාභ වගකීම් මැනීම: ප්‍රධාන ආයුගණක උපකල්පන
ආ) මූල්‍ය මෙවලම්වල සාධාරණ අගය මැනීම
ඇ) මූල්‍ය වත්කම්වල අගය අඩු වීම: අයකර ගත හැකි මුදලට පාදක වූ ප්‍රධාන උපකල්පනය
ඈ) ආදායම් බද්ද (වත්මන් බදු සහ විලම්භිත බද්ද)
ඉ) ප්‍රතිපාදන සහ අවිනිශ්චිතතාවයන් හඳුනා ගැනීම සහ මැනීම: සම්පත් පිටතට ගලා යාමේ සම්භාවිතාව සහ විශාලත්වය පිළිබඳ ප්‍රධාන උපකල්පනය
ඊ) දේපල, පිරියත සහ උපකරණවල (PPE) ප්‍රයෝජනවත් ජීව කාලය ඇස්තමේන්තු කිරීම

2.1.12. ජංගම එදිරිව ජංගම නොවන වර්ගීකරණය

ජංගම/ජංගම නොවන වර්ගීකරණය මත පදනම්ව සමාගම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් හා බැරකම් ඉදිරිපත් කරයි.

වත්කමක් පහත සඳහන් ආකාරයට ඇති විට:

අ) සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන;
ආ) මූලික වශයෙන් වෙළඳාම සඳහා පවත්වා ගනු ලබන;
ඇ) වාර්තාකරණ කාලයෙන් මාස දොළහක් ඇතුළත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන; හෝ
ඈ) වාර්තාකරණ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක්වත් බැරකමක් පියවීම සඳහා හුවමාරු කර ගැනීම හෝ භාවිතා කිරීම සීමා නොකළ මුදල් හෝ මුදල් හා සමාන දෑ; ජංගම වත්කමක් ලෙස වර්ගීකරණය කර ඇත.

සමාගම අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.

වගකීමක් පහත සඳහන් ආකාරයට ඇති විට:

අ) එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ නිරවුල් කිරීමට අපේක්ෂා කෙරේ;
ආ) එය මූලික වශයෙන් වෙළඳාම සඳහා පවත්වා ගනු ලැබේ;
ඇ) වාර්තාකරණ කාලයෙන් මාස දොළහක් ඇතුළත එය නිරවුල් කිරීමට නියමිත වේ; හෝ
ඈ) වාර්තාකරණ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීම පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.1.12. ජංගම එදිරිව ජංගම නොවන වර්ගීකරණය

සමාගම අනෙකුත් සියලුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි. විලම්භිත බදු බැරකම් ජංගම නොවන බැරකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

2.1.13. ණයට ගැනීමේ පිරිවැය

එහි අපේක්ෂිත භාවිතය හෝ විකිණීම සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගතවන වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය වන ණය ලබා ගැනීමේ පිරිවැය, වත්කම් පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය වේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය EIR ක්‍රමය භාවිතයෙන් ඒවා සිදුවන කාල සීමාව තුළ වියදම් කරනු ලැබේ.

අරමුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් ආයතනයක් දරන පොලී සහ වෙනත් පිරිවැයවලින් ණය ගැනීමේ පිරිවැය සමන්විත වේ.

2.1.14. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

'මුදල් ප්‍රවාහ ප්‍රකාශය' පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය වන LKAS - 7 ට අනුකූලව 'වක්‍ර ක්‍රමය' භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශන සකස් කර ඇත. මුදල් සහ මුදල් සමාන දෑ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස් වීමේ සුළු අවදානමකට යටත් වන අතේ ඇති මුදල්, බැංකුවේ ඇති මුදල් සහ කෙටිකාලීන ආයෝජනවලින් සමන්විත වේ.

ලැබුණු පොළිය සහ ලැබුණු ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහයන් ලෙස වර්ගීකරණය කර ඇති අතර ගෙවූ ලාභාංශ මූල්‍ය මුදල් ප්‍රවාහය ලෙස වර්ගීකරණය කර ඇති අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා ගෙවූ පොලිය මෙහෙයුම් මුදල් ප්‍රවාහ යටතේ වර්ගීකරණය කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණු සඳහා ඉල්ලුමට අනුව නැවත ගෙවිය යුතු සහ සමාගමේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා සහ කෙටිකාලීන ණය ගැනීම්, මුදල් හා මුදල් වලට සමාන දෑවල සංඝටකයක් ලෙස ඇතුළත් කර ඇත.

2.2. විදේශ මුදල් පරිවර්තනය කිරීම

ගනුදෙනු සහ ශේෂයන්

සියලුම විදේශ විනිමය ගනුදෙනු ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. සමාගම විසින් ක්‍රියාකාරී මුදල් තීරණය කරනු ලබන අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අයිතම එම ක්‍රියාකාරී මුදල් භාවිතා කරමින් මනිනු ලැබේ.

විදේශීය මුදල්වලින් කරනු ලබන ගනුදෙනු මුලින් සමාගම විසින් ඒවායේ ක්‍රියාකාරී මුදල් තත්ත්කාලීන අනුපාතයන්ට අනුව ගනුදෙනුව පළමුවෙන් පිළිගැනීමට සුදුසුකම් ලැබූ දිනයේ දී වාර්තා කරනු ලැබේ.

විදේශ මුදල්වලින් නම් කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වාර්තාකරණ දිනයේ තත්ත්කාලීන විනිමය අනුපාතයට අනුව ක්‍රියාකාරී මුදල්වලට සමාන ලෙස නැවත පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල් වර්ගයක ඓතිහාසික පිරිවැය අනුව මනිනු ලබන මුදල් නොවන භාණ්ඩ මූලික ගනුදෙනු සිදුකරන දිනට පවතින විනිමය අනුපාත භාවිතා කරමින් පරිවර්තනය කරනු ලැබේ. මුදල් නොවන වත්කම් සහ බැරකම් පරිවර්තනය කරනු ලබන්නේ වටිනාකම් තීරණය කරන විට පැවති විනිමය අනුපාත භාවිතා කරමිනි.

විදේශ මුදල් වෙනස්කම් සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.3. දේපල, පිරියත සහ උපකරණ

රඳවාගෙන ඇති සහ සේවා සැපයීමේදී හෝ පරිපාලනමය අරමුණු සඳහා භාවිතා කර ඇති සහ වසරකට වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කරන තමන් සතු වත්කම් සඳහා ගිණුම්කරණයේදී සමාගම 'දේපල, පිරියත සහ උපකරණ' පිළිබඳ LKAS 16 හි අවශ්‍යතා යොදා ගනු ලැබේ.

2.3.1. හඳුනාගැනීම සහ මැනීම

වත්කම හා ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ගලා ඒමට ඉඩකඩ ඇතැයි සළකන්නේ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි වන්නේ නම්, දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ, හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ මුලින් පිරිවැයට වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත සහ යන්ත්‍රෝපකරණ පසුකාලීනව ප්‍රත්‍යාගණනය කරන විට, එවැනි වත්කම්වල සමස්ත කාණ්ඩයම සාධාරණ වටිනාකමට ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ සඳහා සමූහය පිරිවැය ආකෘතිය යොදා ගන්නා අතර කවර හෝ අනුෂංගික වියදම් සමඟ මිලදී ගැනීම් හෝ ඉදිකිරීම් පිරිවැය අඩු කිරීම ක්‍රමක්ෂිත පිරිවැය සහ කවර හෝ අගය අඩු වීමේ අලාභයට වාර්තා කරනු ලැබේ. සිදුවීම් හෝ තත්ත්වයන්හි වෙනස්වීම් මඟින් පවතින වටිනාකම නැවත ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන විට දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණවල පවතින විටිනාකම අගය අඩු වීම සඳහා සමාලෝචනය කරනු ලැබේ.

2.3.2. සින්නක්කර වත්කම්

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ අයිතමයක පිරිවැය එහි ගත් මිල සහ වත්කමෙන් අදහස් කරන භාවිතය ලබා ගැනීම සඳහා එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අරෝපණය කල හැකි ඕනෑම සෘජු පිරිවැයවලින් සමන්විත වේ. අමුද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය සහ වත්කමෙන් අදහස් කරන භාවිතය ලබා ගැනීම සඳහා එය ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අරෝපණය කල හැකි වෙනත් ඕනෑම පිරිවැය, ස්වයංව තැනුනු වත්කම්වල පිරිවැයට ඇතුලත් වේ. අයිතම කොටස්වලට වෙන් කිරීමට සහ ඉවත් කිරීමට සහ ඒවා ස්ථානගත කර තිබූ පරිශ්‍රය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය සහ සුදුසුකම් ලබන වත්කම් සඳහා ණය ලබා ගැනීමේ පිරිවැය ද මෙයට ඇතුලත් වේ.

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක කොටස්වලට වෙනස් ප්‍රයෝජ්‍ය ජීව කාල ඇති විටදී, ඒවා දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි වෙන්වූ අයිතමයන් (ප්‍රධාන සංඝටක) ලෙස ගිණුම්ගත කරනු ලැබේ. ගනුදෙනුකරුවන්ගෙන් මාරු කරන ලද දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ පාලනය ලබා ගන්නා දිනයේදී සාධාරණ වටිනාකමට මනිනු ලැබේ. අදාළ උපකරණවල ක්‍රියාකාරිත්වයට ඒකාබද්ධ වී ඇති මිලදී ගත් මෘදුකාංග උපකරණවල කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

2.3.3. කල්බදු වත්කම්

හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් සමූහයට පැවරෙන කල්බදු, මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනාගැනීමේදී කල්බදු වත්කම එහි සාධාරණ වටිනාකමට වඩා අඩු සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට සමාන වටිනාකමකට අගය කර ප්‍රාග්ධනිත කරනු ලැබේ. මූලික හඳුනාගැනීමට තදනන්තරව, වත්කම එම වත්කමට අදාළ කර ගත හැකි ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ගිණුම්ගත කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.3.3. කල්බදු වත්කම් (ඉදිරියට.)

ඉඩම් පරිහරණ අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා ගෙවනු ලබන පෙරගෙවුම් කල් බදු කුලී ලබා දී ඇති ප්‍රතිලාභ රටාවට අනුකූලව කල්බදු කාල සීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. අගය අඩු වීමේ අලාභයක් පවතී නම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයහි හඳුනාගනු ලැබේ.

2.3.4. තදනන්තර පිරිවැය

කොටස හා බැඳී ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහයට ලැබිය හැකි වන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි වන්නේ නම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක කොටසක් මාරුකිරීමේ පිරිවැය අයිතමයෙහි පවතින වටිනාකමෙහි හඳුනාගනු ලැබේ. මාරු කළ කොටසෙහි පවතින වටිනාකම හඳුනා නොගනී. දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි එදිනෙදා සේවා වියදම් දරනු ලැබූවක් ලෙස ලාභ අලාභයෙහි හඳුනාගනු ලැබේ.

2.3.5. හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ එහි භාවිතයෙන් හෝ අපහරණයෙන් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනානොගනී. වත්කම් හඳුනානොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කමෙහි පවතින වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) වත්කම් හඳුනානොගත් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

2.3.6. ක්‍රමක්ෂය

දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණයන්හි අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාල ඔස්සේ සරල රේඛීය ක්‍රමය මඟින් ලාභ හෝ අලාභයෙහි ක්‍රමක්ෂය හඳුනාගනු ලැබේ. කල්බදු කාලසීමාව අවසානයේදී සමූහයට හිමිකාරිත්වය ලැබෙන බවට හේතුසාධක සහිතව යම් නිශ්චිත භාවයක් පවතින විටදී හැර කල්බදු වත්කම් කල්බදු කාලසීමාව කෙටි වීම සහ ඒවායේ ප්‍රයෝජ්‍ය කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. භාවිතය සඳහා යොදාගත හැකිව පවතින විටදී වත්කමක ක්‍රමක්ෂය ආරම්භ වන අතර වත්කම විකිණීමට තබා ඇති (හෝ විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කරන ලද අපහරණ කාණ්ඩයකට ඇතුලත් කර ඇති විට) ලෙස වර්ගීකරණය කල දිනය සහ වත්කම හඳුනා නොගන්නා දිනය යන දින දෙකෙන් මුල් දිනයට වත්කමක ක්‍රමක්ෂය අවසන් වේ.

සින්නක්කර ඉඩම් සහ සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් මත ක්‍රමක්ෂය අය නොවේ. ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලය පහත පරිදි වේ:

වත්කම් කාණ්ඩය	ප්‍රයෝජ්‍ය ජීව කාලය (වර්ෂ)
ගොඩනැගිලි	වර්ෂ 13 1/3
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	වර්ෂ 5
පරිගණක, සුභසාධන සහ සන්නිවේදන උපකරණ	වර්ෂ 5
කාර්යාල උපකරණ සහ ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	වර්ෂ 8
මෙවලම් සහ ආම්පන්න	වර්ෂ 5
මෝටර් වාහන	වර්ෂ 4
කන්ටේනර	වර්ෂ 5
පුස්තකාල පොත්	වර්ෂ 8

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.3.6. ක්‍රමක්ෂය (ඉදිරියට.)

ව්‍යාපාර සැලැස්ම සහ උපායමාර්ග, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත ප්‍රවණතා වැනි සාධක මත පදනම්ව සමාගම වාර්ෂිකව PPE හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීවී කාලය සමාලෝචනය කරයි. සඳහන් කරන ලද සාධකවල වෙනස්වීම් මගින් මෙම ඇස්තමේන්තුවල වෙනස්වීම මෙහෙයුම්වල අනාගත ප්‍රතිඵල මත සැළකිය යුතු ලෙස බලපානු ඇත. PPE හි ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ජීව කාලවල අඩුවීම වාර්තාගත ක්ෂය වීමේ භාරය වැඩි කරන අතර PPE ශේෂය අඩු කරයි.

වත්කමක අවශේෂ වටිනාකම හෝ ප්‍රයෝජ්‍ය ජීව කාලය වෙනස් වී ඇති බවට ඇඟවුම් පවතින විට වත්කම්වල ක්ෂය කිරීමේ ක්‍රමය සහ අවශේෂ අගයන් සමාලෝචනය කෙරේ. වර්තමාන අපේක්ෂාවන්හි සැලකිය යුතු වෙනසක් සිදුවී ඇත්නම්, එවැනි වෙනස්කම් පිළිබිඹු වන පරිදි අවශේෂ වටිනාකම, ක්ෂය කිරීමේ ක්‍රමය හෝ ප්‍රයෝජ්‍ය ජීව කාලය සංශෝධනය කරනු ලැබේ.

2.3.7. සිදු කරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් - PPE

වාර්තා කරන දිනට අවසන් නොවූ වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධන වියදම් සිදු කරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වන අතර වර්ෂය තුළ සම්පූර්ණ කර ඇති සහ භාවිතයට ගත හැකි ප්‍රාග්ධන වත්කම් දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ වෙත මාරු කර ඇත.

2.3.8. සිදු කරමින් පවතින කාර්යයන් - පරිගණක මෘදුකාංග (අස්පෘශ්‍ය වත්කම)

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ තිබේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගැනේ. ERP මෘදුකාංගය සංවර්ධනය වෙමින් පවතී. ERP පද්ධතියේ සංවර්ධන පිරිවැය පැහැදිලිව හඳුනාගත හැකිය, විශ්වසනීයව මැනිය හැකි අතර ඒවා අනාගත ආර්ථික ප්‍රතිලාභ සඳහා මග පෑදිය හැකි වන බැවින් කරමින් පවතින කාර්යයන්- අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර ඒවා පිරිවැය යටතේ ඉදිරියට ගෙන යනු ලැබේ.

2.4.මූල්‍ය මෙවලම්

2.4.1. මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්

සමාගම සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන කාණ්ඩ යටතේ වර්ගීකරණය කරයි; ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට, ණය සහ වෙනත් ලැබිය යුතු දේ, විකිණීම සඳහා පවතින සහ කල්පිරීම සඳහා තබා ඇති ආයෝජන වශයෙනි. සමාගම සිය මූල්‍ය බැරකම් පහත දැක්වෙන කාණ්ඩ යටතේ වර්ගීකරණය කරයි; ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට පවතින මූල්‍ය බැරකම් සහ ණය සහ ලබා ගැනීම්.

මූල්‍ය වත්කම්/බැරකම් අත්පත් කර ගත් අරමුණ මත වර්ගීකරණය රඳා පවතී. කළමනාකරණය විසින් මුල් හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම්/වගකීම් වර්ගීකරණය තීරණය කරන අතර සෑම වාර්තාකරණ දිනයකදීම මෙම වෙන් කිරීම නැවත ඇගයීමට ලක් කරනු ලැබේ.

2.4.2. ආරම්භක හඳුනාගැනීම සහ මැනීම

මෙවලමෙහි ගිවිසුම්ගත විධිවිධානවලට ආයතනය පාර්ශවකරුවෙකු වනවිට කාර්යාංශය එහි මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය බැරකමක් හඳුනාගනී.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.4.2. ආරම්භක හඳුනාගැනීම සහ මැනීම (ඉදිරියට.)

සමාගම මුලින් සිය මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට මනිනු ලබයි. මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට නොමැති වූ විට, මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය වන ගනුදෙනු පිරිවැය මූල්‍ය වත්කම් පිරිවැයට එකතු කරනු ලැබේ.

කාර්යාංශය මුලින් සිය මූල්‍ය බැරකම් සාධාරණ වටිනාකමට මනිනු ලබයි. මූල්‍ය බැරකමක් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට නොමැති වූ විට, මූල්‍ය වගකීම් නිකුත් කිරීමට සෘජුවම ආරෝපණය කල හැකි ගනුදෙනු පිරිවැය පවතින වටිනාකමින් අඩු කරනු ලැබේ. තක්සේරු කිරීමෙන් අඩු කරනු ලැබේ.

2.4.3. මූල්‍ය වත්කම් වර්ගීකරණය කිරීම

(i) පහත කරුණු මත පදනම් කර ගනිමින් මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට තදනන්තරව මනිනු ලැබූ, වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමට හෝ ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

අ) මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සමාගමේ ව්‍යාපාර ආකෘතිය සහ
ආ) මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ

(ii) පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරා ඇත්නම් මූල්‍ය වත්කමක් ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ:

අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීම පිණිස මූල්‍ය වත්කම් පවත්වා ගෙන යෑම පරමාර්ථය කරගත් ව්‍යාපාරික
ආ) ආකෘතියක් තුළ පවතින මූල්‍ය වත්කමක් සහ
ඉ) මූලික මුදල සහ ගෙවීමට හිඟව පවතින මූලික මුදලෙහි පොලිය ගෙවීම පමණක්ම වන මුදල් ප්‍රවාහයන් සඳහා මූල්‍ය වත්කමෙහි ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනවල හේතු වනවිට

(iii) වෙනත් විස්තීර්ණ ආදායම හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන මූල්‍ය වත්කම් පහත දැක්වෙන කොන්දේසි දෙකම සපුරා ඇත්නම් මූල්‍ය වත්කමක් හරහා සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

අ) ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් එකතු කිරීම සහ මූල්‍ය වත්කම් විකිණීමෙන් අරමුණ සාක්ෂාත් කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ මූල්‍ය මූල්‍ය වත්කම පැවතීම සහ
ආ) මූලික මුදල සහ ගෙවීමට හිඟව පවතින මූලික මුදලෙහි පොලිය ගෙවීම පමණක්ම වන මුදල් ප්‍රවාහයන් සඳහා මූල්‍ය වත්කමෙහි ගිවිසුම්ගත නියමයන් නිශ්චිත දිනවල හේතු වනවිට

(iv) ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්

ඉහත (ii) සහ (iii) ඡේදයන්ට අනුකූලව වෙනත් විස්තීර්ණ ආදායම් හරහා ක්‍රමක්ෂිත පිරිවැය හෝ සාධාරණ වටිනාකමට මනිනු නොලැබුවහොත් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මනිනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.4.4. මූල්‍ය බැරකම් වර්ගීකරණය කිරීම

පහත සඳහන් අවස්ථාවල හැර මූල්‍ය බැරකම් තදනන්තරව ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ,

අ) ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම්.

ආ) වෙළඳපොළ පවතින පොලී අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයකින් ණයක් ලබා දීමට ඇති වගකීම්.

2.4.5. ප්‍රතිවර්ගීකරණය

(i) මූල්‍ය වත්කම් කළමනාකරණය සඳහා සිය ව්‍යාපාර ආකෘතිය වෙනස් කළ විට පමණක් සමාගම විසින් මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කරනු ලැබේ. සමාගම මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණය කරන්නේ නම්, එවැනි ප්‍රතිවර්ගීකරණයක් ප්‍රති වර්ගීකරණ දිනයේ සිට ඉදිරියට බලපාන අතර කලින් හඳුනාගත් ලාභ, අලාභ (අගය අඩු වීමේ ලාභ හෝ අලාභ ඇතුළුව) නැවත ප්‍රකාශ කරනු නොලැබේ.

(ii) මූල්‍ය බැරකම් ප්‍රතිවර්ගීකරණය කරනු නොලැබේ.

2.4.6. ක්‍රමක්ෂිත පිරිවැය මැනීම

මූල්‍ය වත්කම්වල දළ පවතින වටිනාකමට ඵලදායී පොලී අනුපාතයක් යොදා ගනිමින් ඵලදායී පොලී අනුපාතයක් භාවිතා කරමින් පොලී ආදායම ගණනය කරනු ලැබේ.

2.4.7. අගය අඩු වීම

මූල්‍ය වත්කමක අපේක්ෂිත ණය අලාභ සඳහා වන අලාභ දීමනා සමාගම විසින් හඳුනා ගනී. වාර්තාකරණ දිනයේදී මුලික හඳුනාගැනීම්වලින් පසු මූල්‍ය මෙවලමෙහි ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති විට, ජීව කාලය තුළ අපේක්ෂිත ණය පාඩුවලට සමාන අලාභ දීමනාවක් වෙන් කරනු ලැබේ.

වාර්තාකරණ දිනයේදී මුලික හඳුනාගැනීම්වලින් පසු මූල්‍ය මෙවලමෙහි ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් නොමැති විට, මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන මුදලකට එම මූල්‍ය මෙවලම සඳහා අලාභ දීමනා මනිනු ලැබේ.

2.4.8. මූල්‍ය වත්කම් හඳුනා නොගැනීම

පහත සඳහන් අවස්ථාවලදී සමාගම මූල්‍ය වත්කම් හඳුනානොගනී:

අ) මූල්‍ය වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත් වීම, හෝ

ආ) එය මූල්‍ය වත්කම මාරු කරන අතර මාරුවීම හඳුනානොගැනීම සඳහා සුදුසුකම් ලබන විට.

2.4.9. මූල්‍ය බැරකම් හඳුනානොගැනීම

ශූන්‍ය වූ විට පමණක් මූල්‍ය වගකීමක් (හෝ මූල්‍ය වගකීමක කොටසක්) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කරනු ලැබේ - එනම් කොන්ත්‍රාත්තුවේ නිශ්චිතව දක්වා ඇති වගකීම නිදහස් කරන විට හෝ අවලංගු කරන විට හෝ කල් ඉකුත් වූ විට.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.5. වෙළඳ ලැබිය යුතු දේ

වෙළඳ ලැබිය යුතු දේ යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකුණන ලද භාණ්ඩ හෝ සපයන ලද සේවා සඳහා ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු මුදල් වේ. බොහෝ විකුණුම් සිදු කරනු ලබන්නේ සාමාන්‍ය ණය කොන්දේසි මත වන අතර වෙළඳ ලැබිය යුතු දේ පොලී දරන්නේ නැත. සාමාන්‍ය ණය නියමයන්ට වඩා ණය දීර්ඝ කර ඇති විට, වෙළඳ ලැබිය යුතු දේ ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. මූල්‍ය වත්කම් නොවන වෙනත් ලැබිය යුතු දේ පිරිවැයට මනිනු ලැබේ.

එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී, එම මුදල් අය කර ගත නොහැකි බවට පරමාර්ථ සාක්ෂි තිබේද යන්න තීරණය කිරීම සඳහා වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දැවල පවතින වටිනාකම සමාලෝචනය කරනු ලැබේ. එසේ නම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි අගය අඩුවීමේ අලාභය වහාම හඳුනා ගැනේ.

වෙළඳ ලැබිය යුතු දෑ අගය අඩු වී ඇති බවට පරමාර්ථ සාක්ෂි තිබේද යන්න සමාගම වාර්තා කරන දිනයේදී තක්සේරු කරයි. පවතින ලැබිය යුතු දැවල වර්තමාන තත්ත්වය සහ ඓතිහාසික එකතු කිරීමේ අත්දැකීම් සමාලෝචනය කිරීම මත පදනම්ව අගය අඩු වීමේ අලාභය ගණනය කෙරේ. සත්‍ය හා අපේක්ෂිත අගය අඩු වීම අලාභය පිළිබිඹු කිරීම සඳහා එවැනි විධිවිධාන වරින් වර සකස් කරනු ලැබේ.

2.6. බඩු වට්ටෝරු

පිරිවැයට අඩුවෙන් හා ශුද්ධ උපලබ්ධි අගයට බඩුතොග මනිනු ලැබේ. මිලදී ගැනීමේ පිරිවැය, පරිවර්තනය කිරීමේ පිරිවැය සහ බඩු වට්ටෝරු වර්තමාන ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද වෙනත් වියදම් බඩු වට්ටෝරු පිරිවැයට ඇතුළත් වේ.

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ඇස්තමේන්තුගත විකුණුම් මිල අඩු කිරීම සාක්ෂාත් කර ගැනීමේ පිරිවැය සහ/හෝ ඒවා පවතින තත්ත්වයේ සිට විකිණිය හැකි තත්ත්වයට පරිවර්තනය කිරීමේ පිරිවැයයි. බඩු තොග නිකුත් කිරීම සහ මැනීම සඳහා සමාගම විසින් ප්‍රථමයෙන් ලැබූ ප්‍රථමයෙන් නිකුත් කළ (FIFO) පිරිවැය සූත්‍රය යොදා ගනී.

බඩු තොග නැවත අයකර ගැනීමේ හැකියාව තක්සේරු කිරීම වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී විශේෂඥයෙකු විසින් බඩු තොග චලනය සමාලෝචනය කරනු ලබන අතර ආපසු අයකර ගත නොහැකි යැයි හඳුනාගත් අයිතම වර්ෂය තුළ කපා හරිනු ලැබේ.

සිදු කෙරෙමින් පවතින කාර්යයන්

කෙරෙමින් පවතින කාර්යයන් වර්ෂය අවසානයට සිදු කරන ලද බිල් නොකරන ලද කාර්යයන් සඳහා දරන ලද පිරිවැය මඟින් සිදු නියෝජනය වේ. බිල් කිරීමේ (හෝ තක්සේරු කිරීමේ) අවසාන දිනයේ සිට මූල්‍ය වර්ෂය අවසානය දක්වා දරන ලද වියදම් ප්‍රමාණයෙන් එය මනිනු ලැබේ. නිශ්චිත ව්‍යාපෘති හා සෘජුවම සම්බන්ධ සියලු වියදම් සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව මත පදනම්ව සමූහයේ කොන්ත්‍රාත් ක්‍රියාකාරකම් සඳහා දරන ලද ස්ථාවර හා විචල්‍ය පොදු කාර්ය වියදම් වෙන් කිරීම පිරිවැයට ඇතුලත් වේ.

2.7. වත්කම්වල අගය අඩු වීම

සිදුවිය හැකි අගය අඩු වීමක් පිළිබඳ ඇඟවීමක් තිබේ නම්, බලපෑමට ලක්වූ ඕනෑම වත්කමක හෝ අදාළ වත්කම් සමූහයක අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කර එහි පවතින වටිනාකම සමඟ සසඳන ලැබේ. ඇස්තෙමින්තුගත අයකර ගත හැකි මුදල අඩු නම්, පවතින වටිනාකම මුදල එහි ඇස්තෙමින්තුගත අයකර ගත හැකි මුදල දක්වා අඩු කරනු ලබන අතර, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේදී අගය අඩුවීමේ අලාභයක් වහාම හඳුනා ගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.7. වත්කම්වල අගය අඩු වීම (ඉදිරියට.)

හානිකර අලාභයක් පසුකාලීනව ආපසු හැරේ නම්, වත්කම් හෝ අදාළ වත්කම් සමූහයෙහි පවතින වටිනාකම එහි අයකර ගත හැකි මුදලෙහි සංශෝධිත ඇස්තමේන්තුව දක්වා වැඩි කරනු ලැබේ, නමුත් . පෙර වර්ෂවලදී වත්කම හෝ අදාළ වත්කම් සමූහයක් සඳහා අගය අඩු වීමේ අලාභයක් හඳුනාගෙන නොතිබුණි නම් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයට වඩා වැඩිමනත් වශයෙන් නොවේ. අගය අඩු වීමේ අලාභයක් ආපසු හැරවීම, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වහාම හඳුනා ගැනේ.

2.8. මුදල් හා මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ මුදල් ශේෂයන්ගෙන් සමන්විත වේ. ඉල්ලුමට අනුව ආපසු ගෙවිය හැකි සහ සමාගමේ මුදල් කළමනාකරණයේ අනිවාර්ය අංගයක් වන බැංකු අයිරා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා මුදල් හා මුදල් හා සමාන දෑවල කොටසක් ලෙස ඇතුළත් කර ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑ අතේ ඇති මුදල්, බැංකු සමඟ ඇමතුමක තබා ඇති තැන්පතු, මාස තුනක් හෝ ඊට අඩු මුල් කල්පිරීම් සහිත වෙනත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීලීතාවයක් සහිත ආයෝජන, බැංකු අයිරාවලින් ශුද්ධ වේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දී, ජංගම බැරකම්වල ණය ගැනීම් යටතේ බැංකු අයිරා ඇතුළත් කරනු ලැබේ.

2.9. ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් සමකොටස් යටතේ වර්ගීකරණය කර ඇත.

2.10. වගකීම්, ප්‍රතිපාදන සහ අවිනිශ්චිතතා

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට වර්තමාන වගකීමක් (නෛතික හෝ ඵලදායී) ඇති විට සහ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය විය හැකි වන විට වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි විට වෙන්කිරීම් හඳුනාගනු ලැබේ. කවර හෝ වෙන්කිරීමකට අදාළ වියදම කවර හෝ ප්‍රතිපූරණයකින් ශුද්ධව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි ඉදිරිපත් කරනු ලැබේ. නිරවුල් කළ විට සාක්ෂාත් කරගත යුතු මුදල් වටිනාකමට වෙනත් බැරකම් වාර්තා කරනු ලැබේ. ඓතිහාසික අත්දැකීම් සහ එක් එක් අවස්ථාවල විශේෂිත නියමයන් මත වෙන්කිරීමින ගණනය කරනු ලැබේ. බොහෝ දුරට ඉඩ ඇති ප්‍රතිඵල ඇගයීමේ පදනම මත සමාගම ඇස්තමේන්තුවක් සිදු කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී දන්නා සියලුම වෙන් කිරීම් ගිණුම්ගත කර ඇත.

අනිශ්චිත බැරකම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් මඟින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි හෝ ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදුවිය නොහැකි හෝ පහසුවෙන් මැනිය නොහැකි වර්තමාන බැඳීම් වේ. තවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනිශ්චිත බැරකම්ම් හඳුනානොගන්නා නමුත් එය සිදුවන්නේ දුරස්ථ නොවේ නම් අනාවරණය කරනු ලැබේ.

වර්තමානයේදී, ව්‍යාපාරයේ සාමාන්‍ය පැවැත්ම හේතුවෙන් පැන නගින නඩු සහ හිමිකම් ඉල්ලීම් සඳහා සමාගම සම්බන්ධ වී සිටී. අපේක්ෂිත නඩු සහ හිමිකම් තනි තනිව සහ සමස්තයක් වශයෙන් සමාගමේ මූල්‍ය තත්ත්වය, මෙහෙයුම් ලාභය හෝ මුදල් ප්‍රවාහයන් කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි සමාගම අපේක්ෂා නොකරයි.

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.11. සේවක ප්‍රතිලාභ

අර්ථදැක්වූ දායකත්ව සැලසුම්

අර්ථදැක්වූ දායකත්ව සැලසුම පශ්චාත්-රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර එහිදී දායකත්වය වෙනම අරමුදලකට යවනු ලබන අතර වැඩිදුර මුදල් ගෙවීම සඳහා ආයතනයට නීතිමය හෝ අර්ථකාරී බැඳීමක් නොමැත. සේවකයා විසින් සේවය සපයනු ලබන කාලපරිච්ඡේදයේදී අර්ථ දැක්වූ දායකත්ව සැලසුමට දායකත්වය දැක්වීම සඳහා වන බැඳීම් සේවක ප්‍රතිලාභ වියදමක් ලෙස ලාභ හෝ අලාභයෙහි හඳුනාගනු ලැබේ. අනාගත ගෙවීම්වල මුදල් නැවත ගෙවිමක් හෝ අඩුකිරිමක් පවතින ප්‍රමාණයට පෙරගෙවුම් දායකත්වයන් වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ.

අර්ථදැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්ති භාරකාර අරමුදලේ දායකත්වය සඳහා සුදුසුකම් සහිත සියලුම සේවකයින් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව අදාල දායකත්ව අරමුදල් මඟින් ආවරණය වේ. සමූහය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට සේවකයාගේ දළ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% ක දායකත්වයක් දක්වනු ලැබේ.

අර්ථදැක්වූ ප්‍රතිලාභ බැඳීම

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්මක් යනු අර්ථ දක්වන ලද දායකත්ව සැලැස්මක් නොවන සැලැස්මකි. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලැස්ම මඟින් සේවකයෙකුට විශ්‍රාම යාමෙන් ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය අර්ථ දක්වයි, එය සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතී.

අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත් බැරකම වාර්තාකරණ දිනට අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකමවේ. සේවක ප්‍රතිලාභ - LKAS 19 මඟින් නිර්දේශ කර ඇති ව්‍යාපෘති ඒකක බැර ක්‍රමවේදය (PUC) භාවිතා කරමින් අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම ස්වාධීන ආයුගණකවරුන් විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම් සඳහා ආයුගණක ලාභ සහ අලාභ ඒවා සිදු වූ කාලපරිච්ඡේදයේදී වෙනත් විස්තීර්ණ ආදායම්වල සම්පූර්ණයෙන් හඳුනාගනු ලැබේ. බැරකම සඳහා බාහිරව අරමුදල් සැපයීමක් සිදු කරනු නොලැබේ.

කෙසේවෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව වසර පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණක් සේවකයෙකු සඳහා පාරිතෝෂික බැරකම පැන නගී.

2.12. ජංගම සහ විලම්භිත බදු

ආදායම් බදු වියදම වර්තමාන සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. එය ලාභ හෝ අලාභ ගිණුමෙහි හඳුනාගනු ලැබේ.

2.12.1. වර්තමාන බදු

වර්ෂය සඳහා බදු ගෙවිය යුතු ලාභය හෝ අලාභය මත ලැබිය යුතු හෝ ගෙවිය යුතු අපේක්ෂිත බදු සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු හෝ ලැබිය යුතු බද්දට කළ යුතු යම් ගැලපීමකින් වර්තමාන බද්ද සමන්විත වේ. ගෙවිය යුතු හෝ ලැබිය යුතු වර්තමාන බදු ප්‍රමාණය, ගෙවීමට හෝ ලැබීමට අපේක්ෂා කරන බදු මුදලෙහි හොඳම තක්සේරුව වන අතර එය ගෙවීමට තිබේ නම්, එවැනි ආදායම් බදු සම්බන්ධ අවිනිශ්චිතතාවයන් පිළිබිඹු කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.12.1. වර්තමාන බදු (ඉදිරියට.)

වාර්තාකරණ දිනට බලාත්මක කරන ලද හෝ පනවා ඇති බදු අනුපාතයන් මගින් එය මනිනු ලබයි. වර්තමාන බද්දට ලාභාංශවලින් පැන නගින කවර හෝ බද්දක් ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති පරිදි ආදායම් හා වියදම්වල අංගයන් මත ආදායම් බදු සඳහා වෙන්කිරීම් පදනම් වී ඇති අතර 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතේ විධිවිධාන සහ ඊට අනුෂංගික සංශෝධනවලට අනුකූලව ගණනය කරනු ලැබේ. සමාගම සඳහා අදාළ වන ආදායම් බදු අනුපාතය 28% කි. යම් නිර්ණායක සපුරා ඇත්නම් පමණක් වර්තමාන බදු වත්කම් සහ බැරකම් පියවනු ලැබේ.

ඍජුවම සමකොටස්වල හඳුනාගෙන ඇති අයිතමවලට අදාළ වර්තමාන බද්ද ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි නොව සමකොටස්වල හඳුනාගෙන ඇත. යොදා ගත යුතු බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථාවන්ට අදාළව බදු ලැබීම් ගනු ලබන තත්ත්වයන් කළමනාකරණය වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවල වෙන්කිරීම් සිදු කරනු ලැබේ.

2.12.2. විලම්භිත බදුකරණය

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් හා බැරකම්වල පවතින වටිනාකම සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන වටිනාකම අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්භිත බදු හඳුනා ගැනේ.

බදු අලාභ, භාවිතයට නොගත් බදු බැර සහ අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගත හැකි අතර ඒවා භාවිතා කළ හැක්කේ කවරකටද යන්නට එරෙහිව අනාගත බදු අය කළ හැකි ලාභ පවතිනු ඇති ප්‍රමාණයට හඳුනාගනු ලැබේ. විලම්භිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයේ දී සමාලෝචනය කරනු ලබන අතර අදාළ බදු ප්‍රතිලාභය සාක්ෂාත් කර ගැනීමට තවදුරටත් ඉඩ නොහැකි වන ප්‍රමාණයට අඩු කරනු ලැබේ; අනාගත බදු අය කළ හැකි ලාභයේ සම්භාවිතාව වැඩි වන විට එවැනි අඩු කිරීම් ප්‍රතිවර්ත කරනු ලැබේ.

හඳුනානොගත් විලම්භිත බදු වත්කම් එක් එක් වාර්තාකරණ දිනයේදී නැවත තක්සේරු කරනු ලබන අතර ඒවා භාවිතා කළ හැක්කේ කවරකටද යන්නට එරෙහිව අනාගත බදු අය කළ හැකි ලාභ පවතිනු ඇති ප්‍රමාණයට හඳුනාගනු ලැබේ.

විලම්භිත බද්ද මනිනු ලබන්නේ වාර්තාකරණ දිනට බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත භාවිතා කරමින්, ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් වලට අදාළ වනු ඇතැයි අපේක්ෂා කරන බදු අනුපාතයන් මතය.

විලම්භිත බද්ද මැනීම මඟින් සමාගමෙහි වත්කම් හා බැරකම්වල පවතින වටිනාකම අයකර ගැනීම හෝ නිරවුල් කිරීම සඳහා වාර්තාකරණ දිනයේදී සමාගම අපේක්ෂා කරන ආකාරයට සිදුවන බදු ප්‍රතිවිපාක පිළිබිඹු වේ.

ලාභය හෝ අලාභයෙන් පිටත හඳුනාගෙන ඇති භාණ්ඩවලට අදාළ විලම්භිත බද්ද ලාභයෙන් හෝ අලාභයෙන් පිටත හඳුනාගැනේ. පාදක වූ ගනුදෙනුවට සහසම්බන්ධව විලම්භිත බදු අයිතම වෙනත් විස්තීර්ණ ආදායමෙහි හෝ ඍජුවම සමකොටස්වල හඳුනාගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.12.2. විලම්භිත බදුකරණය (ඉදිරියට.)

ජංගම බදු බැරකම්වලට එරෙහිව ජංගම බදු වත්කම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් තිබේ නම් සහ විලම්භිත බදු එකම බදු අය කළ හැකි ආයතනයට සහ එකම බදුකරණ අධිකාරියට අදාළ නම්, විලම්භීත බදු වත්කම් සහ විලම්භිත බදු බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු සම්බන්ධ වැදගත් විනිශ්චයන්

අලාභ භාවිතා කළ හැක්කේ කවරකටද යන්නට එරෙහිව බදු අය කළ හැකි ලාභයක් පැවතිය හැකි ප්‍රමාණයට භාවිතයට නොගත් බදු අලාභ සඳහා විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. අනාගත බදු සැලසුම් ක්‍රමෝපායන් සමඟ සිදු විය හැකි කාලය සහ අනාගත බදු අය කළ හැකි ලාභයෙහි මට්ටම පදනම් කර ගනිමින් හඳුනාගත හැකි විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා සැලකිය යුතු කළමනාකරණ විනිශ්චයක් අවශ්‍ය වේ.

2.13. කල්බදු

මූල්‍ය කල්බදු

හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙසින් සමූහයට පැවරෙන කල්බදු, මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

මූලික හඳුනාගැනීම සහ තදනන්තර මැනීම

කල්බදු ආරම්භයේ දී තීරණය කරන ලද කල්බදු වත්කමෙහි සාධාරණ වටිනාකමට සහ අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට වඩා වඩා අඩුවෙන් මුලදී, මූල්‍ය කල්බදු සහ මූල්‍ය කල්බදු බැරකම් යටතේ ඇති වත්කම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේදී වත්කම් හා බැරකම් ලෙස හඳුනාගැනේ.

ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ගාස්තු සහ හිඟ බැරකම් අඩු කිරීම අතර තදනන්තර කල්බදු ගෙවීම් විභාජනය කරනු ලැබේ.

මෙහෙයුම් කල්බදු

මෙහෙයුම් කල්බදු යටතේ කරනු ලබන ගෙවීම් කල්බදු කාලය තුළ සරල රේඛීය පදනමක් මත ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

2.14. ආදායම හඳුනාගැනීම

ආදායම යනු ආයතනයක සාමාන්‍ය ක්‍රියාකාරකම්වලදී ලැබෙන ආදායමයි. SLFRS 15-ට අනුව, භාණ්ඩ හෝ සේවාවල පාලනය ගනුදෙනුකරුවා ලබා ගන්නා විට සහ සමාගම හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රමාණයට (සමාගම කාර්ය සාධන වගකීමක් සපුරාලන විට) ආදායම හඳුනා ගැනේ. විනිශ්චයන් අවශ්‍ය වන පාරිභෝගිකයා විසින් කිසියම් වේලාවක හෝ කාලය ගත වීමෙන් එම වත්කම පාලනය කරන විට භාණ්ඩ හෝ සේවාවක් මාරු කරනු ලැබේ. SLFRS 15-මඟින් ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ලැබෙන ආදායම හඳුනාගැනීම සඳහා පියවර පහක ආකෘතියක් හඳුන්වා දෙයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.14. ආදායම හඳුනාගැනීම (ඉදිරියට.)

පහත සඳහන් සියලු නිර්ණායක සපුරා ඇති විට පමණක් සමාගම ගනුදෙනුකරුවෙකු සමඟ ගිවිසුම්ගත වීම සිදු කරනු ලැබේ:

අ) කොන්ත්‍රාත්තුවේ පාර්ශවකරුවන් කොන්ත්‍රාත්තුව අනුමත කර ඇති විට (ලිඛිතව, වාචිකව හෝ වෙනත් චාරිත්‍රානුකූල ව්‍යාපාරික පිළිවෙත්වලට අනුකූලව) සහ ඔවුන්ගේ අදාළ වගකීම් ඉටු කිරීමට කැපවී සිටින විට;

ආ) මාරු කළ යුතු භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් එක් එක් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සමාගමට හඳුනාගත හැකි විට;

ඇ) මාරු කළ යුතු භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීම් නියමයන් සමාගමට හඳුනාගත හැකි විට;

ඈ) කොන්ත්‍රාත්තුවට වාණිජමය හරයක් ඇති විට (එනම්, සමාගමේ අනාගත මුදල් ප්‍රවාහවල අවදානම, වේලාව හෝ ප්‍රමාණය කොන්ත්‍රාත්තුවේ ප්‍රතිඵලයක් ලෙස වෙනස් වනු ඇතැයි අපේක්ෂා කරන විට); සහ

ඉ) පාරිභෝගිකයා වෙත මාරු කරනු ලබන භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවක් වශයෙන් සමාගම විසින් හිමිකම් ලබන වටිනාකම ලබා ගැනීමට හැකි වන විට.

ඉදිකිරීම් කොන්ත්‍රාත්

ඉදිකිරීම් ආදායම

SLFRS 15-ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්තුවලින් ලැබෙන ආදායම ට අනුකූලව (ආදාන ක්‍රමය මත පදනම්ව) කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ අවධියට සමානුපාතිකව ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඉදිකිරීම් ආදායම හඳුනාගැනේ.

ආදාන ක්‍රමය යටතේ, එම කාර්යසාධන වගකීම්වල තෘප්තිය සඳහා අපේක්ෂිත මුළු යෙදවුම්වලට (ඇස්තමේන්තුගත පිරිවැය) සාපේක්ෂව කාර්ය සාධන වගකීම් තෘප්තිමත් කිරීම සඳහා සමාගමේ ආදානයේ පදනම මත ආදායම හඳුනාගනු ලැබේ.

STC අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින ව්‍යාපෘති සඳහා, කොන්ත්‍රාත්තුවේ එකඟ වූ ආරම්භක ආදායමෙන් 90% ක් සහ කොන්ත්‍රාත් වැඩ, හිමිකම් සහ දිරි දීමනා ගෙවීම්වල යම් වෙනසක්, සමාගම හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රමාණයට පමණක් කොන්ත්‍රාත් ආදායම හඳුනාගනු ලැබේ.

STC අනුමත කොන්ත්‍රාත් ආදායම් අනුමැතිය STC වෙතින් ලැබුනු පසු එයට අනුව කොන්ත්‍රාත් ආදායම සංශෝධනය කරනු ලැබේ (සත්‍ය වශයෙන් හිමිකම් ඇති මුදල). වෙනත් කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත් මිලට කොන්ත්‍රාත්තුවේ එකඟ වූ ආරම්භක මුදල සහ කොන්ත්‍රාත් කාර්යයේ යම් වෙනස්කම් ඇතුළත් වේ.

2.15. ශුද්ධ මූල්‍ය ආදායම / (පිරිවැය)

2.15.1. මූල්‍ය ආදායම

ආයෝජනය කරන ලද අරමුදල් සඳහා පොලී ආදායමෙන් මූල්‍ය ආදායම සමන්විත වේ. ආදායම් ඵලදායී පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ, එය මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ පවතින වටිනාකමට, අදාළ වන පරිදි අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාල පරිච්ඡේදයක් හරහා මූල්‍ය උපකරණයේ ඇස්තමේන්තුගත අනාගත ලැබීම් නියමාකාරයෙන් වට්ටම් කරන අනුපාතය වේ. පොලී ආදායම ශුද්ධ මූල්‍ය ආදායම යටතේ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

2.15.2. මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය ණය ගැනීම් සඳහා වන පොලී වියදම්වලින් සමන්විත වේ. ඵලදායී පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් උපචිත වන පරිදි පොලී වියදම වාර්තා කරනු ලැබේ, එය මූල්‍ය බැරකමෙහි ශුද්ධ පවතින වටිනාකමට, අදාළ වන පරිදි අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාල පරිච්ඡේදයක් හරහා මූල්‍ය උපකරණයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් නියමාකාරයෙන් වට්ටම් කරන අනුපාතය වේ.

2.15.2. මූල්‍ය පිරිවැය (ඉදිරියට.)

ඉදිකිරීම් හෝ සංවර්ධන කාල පරිච්ඡේදය තුළ එම වත්කම්වල පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද දේපල, පිරියත සහ උපකරණ ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා සෘජුවම ආරෝපණය කර ඇති ඒවා හැර, ණය ගැනීමේ පිරිවැය ඒවා දරනු ලබන කාල සීමාව තුළ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.16. වියදම් හඳුනාගැනීම

දරන ලද පිරිවැය හා නිශ්චිත ආදායම් අයිතමයන්ගේ ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවයක් මත ලාභ හෝ අලාභයෙහි වියදම් හඳුනාගනු ලැබේ. වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේදී ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලු වියදම් ආදායමට අය කරනු ලැබේ. අලුත්වැඩියාවන් සහ අලුත් කිරීම් වියදම් දරන ලද වර්ෂයේ ලාභය හෝ අලාභය සඳහා අය කෙරේ. උපචිත පදනම මත වියදම් හඳුනාගනු ලැබේ.

ඉදිකිරීම් කොන්ත්‍රාත්

වර්ෂය තුළ එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා දරන ලද ආරෝපණය කළ හැකි මුළු පිරිවැය, ඉදිකිරීම් පිරිවැයට ඇතුළත් කර ඇත.

වෙනත් වියදම්

ව්‍යාපාරය කරගෙන යෑමේදී දරන ලද සියලු වියදම් සහ දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ කාර්යක්ෂම අයුරින් නඩත්තු කිරීමෙහි දරන ලද සියලු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට එක් කර ඇත.

ලාභාංශ බෙදාහැරීම

සමාගමේ කොටස් හිමියන් විසින් ලාභාංශ අනුමත කරන කාල සීමාව තුළ සමාගමේ කොටස් හිමියන්ට ලාභාංශ බෙදා හැරීම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.17. වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසුව සිදු වන සිදු වීම්

වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දුන් දිනය අතර සිදුවන හිතකර හෝ අහිතකර සිදුවීම් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම් වේ.

වාර්තාකරණ දින පසුව සිදුවන සිදුවීම්වල වැදගත්භාවය සළකා බලනු ලබන අතර සුදුසු ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය තැන්වලදී මූල්‍ය ප්‍රකාශනවල සිදු කරනු ලැබේ.

2.18. කොටසක් සඳහා ඉපැයීම්

සමාගම සිය සාමාන්‍ය කොටස් සඳහා කොටසකට මූලික ඉපැයීම් (EPS) ඉදිරිපත් කරයි. සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපණය කළ ලාභය හෝ අලාභය කාල සීමාව තුළ හිඟව පැවති සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීමෙන් මූලික EPS ගණනය කරනු ලැබේ.

3. සම්බන්ධිත පාර්ශව අනාවරණය කිරීම

3.1. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු කිරීමේ නියමයන් සහ කොන්දේසි

සම්බන්ධිත පාර්ශවයන්ට විකිණීම සහ සම්බන්ධිත පාර්ශවයන්ගෙන් මිලදී ගැනීම සිදු කරනු ලබන්නේ එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවට මත බලපෑම් සිදු නොකරන ස්වාධීන ගනුදෙනුවල (arm's length transactions) සමාන කොන්දේසි මතය. වසර අවසානයේදී හිඟ ශේෂයන් අනාරක්ෂිත වන අතර පොලී රහිත වන අතර නිරවුල් කිරීම මුදල් ගෙවීම මඟින් සිදු වේ. සම්බන්ධිත පාර්ශවවලින් ලැබිය යුතු දේ හෝ ගෙවිය යුතු දේ සඳහා කිසිදු සහතිකයක් ලබා දී හෝ ලැබී නොමැත.

3.2. ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන් (KMP) සහ ඔවුන්ගේ පවුල්වල සමීප සාමාජිකයන් (CFM) සම්බන්ධ වන ගනුදෙනු, පිළියෙළ කිරීම සහ ගිවිසුම්

LKAS 24 - 'සම්බන්ධිත පාර්ශව අනාවරණයන්' ට අනුව, ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති පිරිස ප්‍රධාන කළමනාකරණ පිරිස් වේ. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළුව) සමාගමේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර ඇත.

KMP හි සමීප පවුලේ සාමාජිකයන් (CFM) යනු ආයතනය සමඟ ගනුදෙනු කිරීමේදී එම KMPs බලපෑම් කිරීමට අපේක්ෂා කළ හැකි හෝ බලපෑම් කිරීමට යටත් විය හැකි පවුලේ සාමාජිකයන් ය.

අ) පුද්ගලයාගේ ගෘහ සහකරු සහ දරුවන්;
ආ) පුද්ගලයාගේ ගෘහ සහකරුගේ දරුවන්; හා
ඇ) පුද්ගලයාගේ හෝ පුද්ගලයාගේ ගෘහ සහකරුගේ යැපෙන්නන්.

මෙයට ඇතුළත් විය හැකිය:

CFM යනු ආයතනයට සම්බන්ධ පාර්ශවයන් ය. වර්ෂය තුළ CFM සමඟ කිසිදු ගනුදෙනුවක් සිදු නොවීය.

3.3. අධ්‍යක්ෂවරුන්ගේ ණය

සමාගමේ අධ්‍යක්ෂවරුන්ට ණය ලබා දී නොමැත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

4. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති

මූල්‍ය අවදානම් කළමනාකරණය යනු මූල්‍ය උපකරණයක් භාවිතා කරමින් සමාගම මුහුණු දී සිටින අවදානම් නිරාවරණය වීම කළමනාකරණය කිරීම සඳහා සමාගමක ආර්ථික වටිනාකම් භාවිතයක් භාවිතා කිරීම ය. සමාගමේ ප්‍රධාන මූල්‍ය වත්කම්වලට වෙළඳාම සහ වෙනත් ලැබිය යුතු දේ සහ එහි මෙහෙයුම්වලින් කෙලින්ම ලබා ගන්නා මුදල් සහ කෙටිකාලීන තැන්පතු ඇතුළත් වේ.

වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සමාගම භාවිතා කරන ප්‍රධාන මූල්‍ය බැරකම් වේ. සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීම සහ එහි මෙහෙයුම් සඳහා සහාය වීමට ඇපකර සැපයීම මෙම මූල්‍ය ආයෝජනවල ප්‍රධාන අරමුණ වේ.

සමාගම මුහුණ දී ඇති අවදානම හඳුනාගැනීම සහ විශ්ලේෂණය කිරීම සහ සුදුසු අවදානම් සීමාවන් සහ පාලනයන් නියම කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත. අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිතිපතා සමාලෝචනය කරනු ලබන අතර පුහුණුව, කළමනාකරණ ප්‍රමිතීන් සහ ක්‍රියාපටිපාටි තුළින් සියලුම සේවකයන්ට ඔවුන්ගේ කාර්යභාරයන් සහ බැඳීම් අවබෝධ කර ගන්නා විනයානුකූල ඵලදායී පාලන පරිසරයක් සකස් කිරීම අරමුණු කර ඇත.

සමාගමේ විගණන කමිටුව විසින් සමාගමේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම කළමනාකරණය අධීක්ෂණය කරන්නේ කෙසේද යන්න අධීක්ෂණය කරන අතර සමාගම මුහුණදෙන අවදානමට අදාළව අවදානම් කළමනාකරණ රාමුව සමාලෝචනය කරයි. සමාගමේ විගණන කමිටුවට එහි අධීක්ෂණ කාර්යභාරය සඳහා අභ්‍යන්තර විගණනය සහාය වේ. අභ්‍යන්තර විගණනය මඟින් අවදානම් කළමනාකරණ පාලනයන් සහ ක්‍රියාපටිපාටි පිළිබඳ ඒකාකර සහ තත්කාලීන සමාලෝචන සිදු කරනු ලබන අතර, එහි ප්‍රතිඵලය විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ. කමිටුව එහි ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිරන්තරයෙන් වාර්තා කරයි.

වෙළඳපළ අවදානම, ණය අවදානම, ද්‍රවශීලතා අවදානම වැනි ප්‍රධාන මූල්‍ය අවදානම්වලට සමාගම නිරාවරණය වේ.

පහත සාරාංශගත කර ඇති එක් එක් වර්ගයේ අවදානම් කළමනාකරණය සඳහා වන ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පුනර්ජීවනය, සත්‍යාපනය සහ එකඟ වීම සිදු කරයි.

4.1. වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු වෙළඳපළ මිලෙහි වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණවල අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ප්‍රතිලාභ ප්‍රශස්ත කරන අතරම පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළඳපළ අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීම සහ පාලනය කිරීමයි. අවදානම් කළමනාකරණ කමිටුව විසින් නියම කර ඇති මාර්ගෝපදේශ අනුව එවැනි සියලු ගනුදෙනු සිදු කරනු ලැබේ.

වෙළඳපළ අවදානම පහත දැක්වෙන අවදානම්වලින් සමන්විත වේ:

a) පොලී අනුපාත අවදානම
b) මුදල් වර්ග අවදානම
c) පාරිභෝගික ද්‍රව්‍ය මිල අවදානම
d) සමකොටස් මිල අවදානම

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

4.1. වෙළඳපල අවදානම (ඉදිරියට.)

වෙළඳපළ අවදානමට ලක්වූ මූල්‍ය උපකරණවලට ප්‍රධාන වශයෙන් තැන්පතු ඇතුළත් වේ.

සමාගම මුහුණ දෙන වෙළඳපළ අවදානම්වලට මුදල් අවදානම, පොලී අනුපාත අවදානම සහ වෙනත් මිල අවදානම් ඇතුළත් වේ.

4.1.1. පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු වෙළඳපළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ප්‍රවාහයන් උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපළ පොලී අනුපාතය වෙනස් වීමේ අවදානමට නිරාවරණය වීම මූලික වශයෙන් පාවෙන අනුපාතය සමඟ සමාගමේ තැන්පතුවලට අදාළ වේ. පොලී අනුපාතවල අහිතකර විචලනයන් හේතුවෙන් අවදානමට ලක් විය හැකි පොලී උපයන බැංකු තැන්පතු සමාගමට සතු වේ.

4.2. ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය උපකරණයක් හෝ පාරිභෝගික කොන්ත්‍රාත්තුවක් යටතේ පාර්ශවකරුවන් තම වගකීම් ඉටු නොකිරීමෙන් මූලය අලාභයක් ඇති විය හැකි අවදානමකි. සමාගම සිය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (මූලික වශයෙන් වෙළඳ ලැබිය යුතු දේ) සහ බැංකු හා මූල්‍ය ආයතන සමඟ ඇති තැන්පතු ඇතුළු මූල්‍යකරණ කටයුතුවලින් සහ වෙනත් මූල්‍ය උපකරණවලින් ණය අවදානමට නිරාවරණය වේ.

වෙළඳ ලැබිය යුතු දෑ

සමාගමේ පාරිභෝගික ණය අවදානම් කළමනාකරණයට අදාළව ස්ථාපිත කර ඇති ප්‍රතිපත්ති ක්‍රියාපටිපාටි සහ පාලනයන්ට යටත්ව එක් එක් මූලික කාර්යාල මඟින් පාරිභෝගික ණය අවදානම් කළමනාකරණය සිදු කරනු ලැබේ.

එක් එක් ගනුදෙනුකරුගේ තනි තනි ලක්ෂණ ණය අවදානමට සමාගම නිරාවරණය වීමට ප්‍රධාන වශයෙන් බලපානු ලබයි. සෑම මූලික කාර්යාලයක්ම ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය තත්ත්වය නිරීක්ෂණය කරයි. එක් එක් වාර්තාකරණ දිනයේ දී ප්‍රධාන සේවාදායකයින් සඳහා තනි පදනමක් මත අගය අඩුවීමේ විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ. ගණනය කිරීම සත්‍ය දරන ලද ඓතිහාසික දත්ත මත පදනම් වේ.

සමාගමෙහි ගනුදෙනුකරුවන්ගෙන් බහුතරයක් රජයේ දෙපාර්තමේන්තු නියෝජනය කරන අතර වැදගත් ගෙවීම්, ඇපකරවල පිටුබලය ලබන අතර මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර ගනුදෙනුකරුවන් සමඟ කොන්ත්‍රාත්තුමය ගිවිසුම්වලට එළඹෙන බැවින් වෙළඳ ලැබිය යුතු දේ සම්බන්ධයෙන් අවදානමෙහි ප්‍රමාණය අඩු යැයි සමාගම තක්සේරු කරයි.

වාර්තා කිරීමේ දිනයට ණය අවදානමට උපරිම නිරාවරණය වීම;

දිනය	වෙළඳ ණයගැතියන් රු.
2018 දෙසැම්බර් 31 දිනට	4,059,164,389
2019 දෙසැම්බර් 31 දිනට	4,151,195,129

4.3. ද්‍රවශීලීතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමෙන් පියවා ඇති එහි මූල්‍ය බැරකම් හා බැඳී ඇති බැඳීම් ඉටු කිරීමේදී සමාගමට දුෂ්කරතා ඇතිවීමේ අවදානමයි. ද්‍රවශීලතා සැළසුම් මෙවලම් භාවිතා කරමින් අරමුදල් හිඟ වීමේ අවදානම සමාගම අධීක්ෂණය කරයි.

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම සඳහා සමාගමේ ප්‍රවේශය වන්නේ, සමාගමේ කීර්ති නාමයට පිළිගත නොහැකි පාඩු හෝ හානියක් සිදු නොවී, මූල්‍ය වත්කම් හා බැරකම් අතර සමතුලිතතාවය පවත්වා ගෙන යාම සහ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහයන් පුරෝකථනය කිරීම සඳහා අවශ්‍ය වූ සෑමවිටම ප්‍රමාණවත් තරම් ද්‍රවශීලතාවයක් පැවතීම හැකි තාක් දුරට සපුරාලන බව සහතික කිරීමයි.

මූල්‍ය බැරකම් මත අපේක්ෂිත මුදල් ප්‍රවාහයට වඩා වැඩි මුදලකට තම මුදල් හා මුදල් හා සමාන දෑ සහ ඉහළ අලෙවිකරණය කළ හැකි වෙනත් ණය උපකරණවල මට්ටම පවත්වා ගැනීම සමාගම අරමුණු කරයි. ද්‍රවශීලතා අවදානම මැනීම සහ අවම කිරීම සඳහා, සමාගම සිය ශුද්ධ මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමීපව අධීක්ෂණය කිරීම, මුදල් හා මුදල් හා සමාන දෑ මට්ටම පුරෝකථනය කිරීම සහ පවත්වාගෙන යාම සහ මූල්‍ය ආයතනවලින් කැපවූ අරමුදල් පහසුකම් ලබා ගැනීම සිදු කරයි. තවද, මුදල් කළමනාකරණය ඇතුළුව නිසි කාරක ප්‍රාග්ධන කළමනාකරණයක් තුළින් සමාගම එහි ද්‍රවශීලතා අවදානම අවම කරයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

		CESL	
		2019	2018
		රු.	රු.
5.	**ආදායම**		
	ඉදිකිරීම් ආදායම උපදේශන	10,447,426,924	11,162,314,163
	ආදායම	27,287,368	26,800,001
		10,474,714,291	**11,189,114,164**
6.	**විකුණුම් පිරිවැය**		
	ද්‍රව්‍ය	4,306,101,476	4,203,562,421
	කම්කරු ශ්‍රමය	3,227,488,798	3,498,167,680
	ප්‍රවාහන වියදම්	351,999,809	744,866,676
	මෙවලම්	24,194,109	17,567,443
	පොදු කාර්ය සහ විවිධ වියදම්	1,240,966,659	1,136,923,456
	ඉදිකිරීම් සේවාවන්	542,636,736	801,691,870
		9,693,387,587	**10,402,779,545**
7.	**වෙනත් ආදායම්**		
	විවිධ ආදායම	-	-
	වාහන කුලි ආදායම	38,277,443	58,207,817
	යන්ත්‍රෝපකරණ කුලියට දීම		-
	වාහන කුලි කොමිසම් මුදල	1,935,949	973,412
	ආදායම් ගාස්තු ආදායම	-	340,150
	විවිධ ආදායම	60,209,517	27,401,200
	ටෙන්ඩර් ගාස්තු ආදායම	1,273,890	1,471,770
	ඇස්ෆල්ට් කොන්ක්‍රීට්, ඒබීසී සහ සුන්බුන් විකුණුම් ආදායම		
	නොපියවූ ණය සඳහා ප්‍රතිපාදන හැරවීම	-	7,350,768
	වත්කම් බැහැර කිරීමේ ලාභය / (අලාභය)	152,886	(1,680,257)
	ඇස්ෆල්ට් / කුඩු යන්ත්‍රවලින් ලැබීම් ලාභය / (අලාභය)	4,180,454	10,185,248
		106,030,139	**104,250,107**
	මෙහෙයුම් ලාභය		
	මෙහෙයුම් ලාභය ගණනය කිරීමේදී පහත අයිතම අයකර/(බැරකර ඇත)		
	අධ්‍යක්ෂවරයාගේ වේතන	1,252,250	1,255,700
	විගණකවරයාගේ වේතන	1,971,880	4,111,985
	දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ ක්‍රමක්ෂය	157,733,292	165,689,241
	පුණ්‍ය කටයුතු සහ පරිත්‍යාග	1,743,436	1,541,813
	බොල් සහ අනිශ්චිත ණය සඳහා වෙන් කිරීම්	-	-
	සේවක ප්‍රතිලාභ පිරිවැය	341,903,431	289,433,660
	සේවක ප්‍රතිලාභ පිරිවැය		
	වැටුප් සහ වේතන	240,715,884	211,520,788.85
	අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් සඳහා දායකත්වය	20,070,045	18,466,992.87
	අනිකාල, දිරි දීමනා සහ වෙනක් දීමනා	81,117,502	59,445,878.07
8.	**ශුද්ධ මූල්‍ය ආදායම**		
	මූල්‍ය ආදායම		
	පොලී ආදායම	191,743,215	150,173,742
		191,743,215	**150,173,742**
	මූල්‍ය පිරිවැය		
	පොලී වියදම්	(40,440,063)	(44,240,151)
		(40,440,063)	**(44,240,151)**
	ශුද්ධ මූල්‍ය ආදායම	**151,303,152**	**105,933,591**
9.	**බදු වියදම්**		
	වර්ෂය සඳහා විලම්බිත බදු	9,603,481	9,580,963
	වර්ෂය සඳහා ආදායම් බදු	55,782,900	42,056,740
		65,386,381	**51,637,703**

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

10 දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

10 CESL

	ඉඩම්	ගොඩනැගිලි	ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	ඉදිකිරීම් උපකරණ සහ මෙවලම්	කාර්යාල උපකරණ	පිරියත සහ යන්ත්‍රෝපකරණ	කන්ටේනර	පරිගණක	මෝටර් වාහන	පුස්තකාල පොත්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය											
2019 ජනවාරි 1 දිනට ශේෂය	8,415,147	47,990,154	27,720,393	320,945,570	41,677,322	313,701,582	47,185,885	55,943,874	393,365,386	402,076	1,257,347,389
වර්ෂය තුළ එකතු කිරීම්	(15,175,928)	0	8,626,081	106,438,673	8,458,933	14,368,867	5,071,492	12,492,405	126,400	68,313	140,475,237
වර්ෂය තුළ බැහැර කිරීම්			(74,736)	(1,839,430)	(267,739)	(951,592)		(531,925)	(67,537,010)	-	(71,202,433)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,415,147**	**47,990,154**	**36,271,738**	**425,544,813**	**49,868,515**	**327,118,857**	**52,257,377**	**67,904,354**	**325,954,776**	**470,389**	**1,341,796,121**
සමුච්චිත ක්ෂයවීම්											
2019 ජනවාරි 1 දිනට ශේෂය		27,836,375	10,706,827	174,367,228	17,411,602	191,405,707	17,261,204	30,539,005	378,844,456	66,388	848,438,791
ආරම්භ ශේෂයට ගැලපීම			6,493	(20,161,976)	(16,700)			(19,814)			(20,191,997)
2019 ජනවාරි 1 වන විට ගැලපීම් කරන ලද ආරම්භක ශේෂය	-	**27,836,375**	**10,713,320**	**154,205,252**	**17,394,902**	**191,405,707**	**17,261,204**	**30,519,191**	**378,844,456**	**66,388**	**828,246,794**
වර්ෂය තුළ එකතු කිරීම්		4,607,149	3,977,719	67,235,767	6,139,665	48,847,210	6,039,981	10,372,389	10,460,394	53,019	157,733,292
වර්ෂය තුළ බැහැර කිරීම්			(44,986)	(1,500,297)	(211,861)	(762,114)		(484,792)	(67,537,010)		(70,541,060)
ගැලපීම්											-
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය		**32,443,524**	**14,646,053**	**219,940,721**	**23,322,706**	**239,490,803**	**23,301,184**	**40,406,787**	**321,767,840**	**119,407**	**915,439,026**
ශුද්ධ පොත් අගය											
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,415,147**	**20,153,779**	**17,013,566**	**146,578,342**	**24,265,720**	**122,295,875**	**29,924,681**	**25,404,869**	**14,520,930**	**335,688**	**408,908,599**
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,415,147**	**15,546,630**	**21,625,685**	**205,604,092**	**26,545,810**	**87,628,055**	**28,956,192**	**27,497,567**	**4,186,936**	**350,982**	**426,357,095**

	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය											
2018 ජනවාරි 1 දිනට ශේෂය	8,415,147	47,990,154	23,525,114	250,986,282	36,992,263	288,061,012	41,661,885	48,358,969	391,307,386	169,717	1,137,467,929
වර්ෂය තුළ එකතු කිරීම්	-	-	4,195,280	69,959,288	4,685,059	25,640,570	5,524,000	7,584,905	2,058,000	232,360	119,879,460
වර්ෂය තුළ බැහැර කිරීම්										-	-
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**8,415,147**	**47,990,154**	**27,720,393**	**320,945,570**	**41,677,322**	**313,701,582**	**47,185,885**	**55,943,874**	**393,365,386**	**402,076**	**1,257,347,389**
සමුච්චිත ක්ෂයවීම්											
2018 ජනවාරි 1 දිනට ශේෂය	-	19,281,946	7,564,359	113,473,133	12,067,786	137,554,132	15,895,157	21,370,338	355,512,025	30,673	682,749,549
වර්ෂය තුළ එකතු කිරීම්		8,554,429	3,142,468	60,894,094	5,343,816	53,851,575	1,366,046	9,168,667	23,332,431	35,715	165,689,241
වර්ෂය තුළ බැහැර කිරීම්											
ගැලපීම											
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**27,836,375**	**10,706,827**	**174,367,228**	**17,411,602**	**191,405,707**	**17,261,204**	**30,539,005**	**378,844,456**	**66,388**	**848,438,791**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

දෙසැම්බර් 31 වැනි දිනට	CESL	
	2019	2018
	රු.	රු.

10.2. සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ

මූල්‍ය තත්ත්වය ප්‍රකාශන දිනට තවමත් භාවිතයේ පවතින සමාගමේ සම්පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරන ලද දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය පහත පරිදි වේ.

සින්නක්කර PPE	සම්පූර්ණයෙන් ක්‍රමක්ෂිත	ක්ෂය කිරීම	එකතුව
ඉඩම්		-	-
ගොඩනැගිලි		47,990,154	**47,990,154**
මෝටර් වාහන	314,742,952	11,211,824	**325,954,776**
කාර්යාල උපකරණ	7,975,263	41,893,253	**49,868,515**
ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්	3,884,760	32,386,978	**36,271,738**
ඉදිකිරීම් උපකරණ	90,655,124	334,889,689	**425,544,813**
පුස්තකාල පොත්	65,650	404,739	**470,389**
පිරියත සහ යන්ත්‍රෝපකරණ	176,806,262	150,312,596	**327,118,857**
පරිගණක	20,455,101	47,449,253	**67,904,354**
බහාලුම්	24,744,001	27,513,375	**52,257,377**
	639,329,113	**694,051,861**	**1,333,380,974**

11. බදු ඉඩම්

ඉඩම් පරිහරණය කිරීමේ අයිතිය ලබා ගැනීම සඳහා ගෙවනු ලබන පෙරගෙවුම් කල්බදු කුලිය, ලබා දී ඇති රටාවට අනුකූලව කල්බදු කාල සීමාව තුළ ක්‍රමක්ෂය කර ඇත.

වර්ෂය ආරම්භයේදී	-	-
වර්ෂය තුළ අත්පත් කර ගැනීම	15,425,266	-
ක්‍රමක්ෂය	(249,340)	-
වර්ෂය අවසානයේදී	**15,175,926**	-

11.1. කල්බදු දේපල පිළිබඳ විස්තර

කල්බදු දේපල යනු සබරගමුව මූලික කාර්යාලය ඉදිකිරීමට භාවිතා කරන ඉඩමයි. නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමඟ ඇති කර ගත් වසර 30 ක දීර්ඝ කාලීන බදු ගිවිසුමකට අනුව බදු දී තිබේ. එය 2019 ජූලි 08 වන දින සිට ආරම්භ වන අතර, 2019 ජූලි 08 සිට ආරම්භ වන වසර 30 ක කාලයක් තුළ සරල රේඛීය පදනමින් ක්‍රමක්ෂය කර ඇත.

දේපළ	ඉඩම් ප්‍රමාණය (ප්‍රදේශය)	බදු කාලය
සැලසුම් අංක 582 (කැබලි අංක 7,8 සහ 9)		
නව නගරය	සැලසුම් අංක 582 60P	අවුරුදු 30 සිට
රත්නපුර		08.07.2019

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

දෙසැම්බර් 31 වැනි දිනට		CESL	
		2019	2018
		රු.	රු.
12.	**සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්**		
	සමාගම තුළ සකස් කළ මෘදුකාංග		
	ශේෂය B/F -	26,306,616	9,365,714
	වර්ෂය තුළ දරන ලද පිරිවැය	**1,520,000**	1,010,000
		27,826,616	**10,375,714**
	ගොඩනැගිලි ඉදිකිරීම		
			15,907,662
	වර්ෂය තුළ දරන ලද පිරිවැය	**3,810,220**	23,240
	මාරු කරන ලද	**-**	-
		31,636,836	**26,306,616**
13.	**ආයෝජන**		
	දීර්ඝ කාලීන ආයෝජන (සටහන 13.1)	-	-
	කෙටි කාලීන ආයෝජන (සටහන 13.2)	1,759,981,590	1,111,071,025
		1,759,981,590	**1,111,071,025**
13.1.	**දීර්ඝ කාලීන ආයෝජන**		
	ණය සහ ලැබිය යුතු මූල්‍ය වත්කම්		
	ස්ථාවර තැන්පත්වල ආයෝජන	-	-
		-	-
13.2.	**කෙටි කාලීන ආයෝජන**		
	Repo	-	8,100,000
	කෙටි කාලීන ආයෝජන	1,759,981,590	1,977,005,933
		1,759,981,590	**1,985,105,933**
14.	**බඩු වට්ටෝරු**		
	බඩු වට්ටෝරු - ඉදිකිරීම් ද්‍රව්‍ය	726,553,318	744,403,110
	ද්‍රව්‍ය බැහැර කිරීම	561,397	901,326
		727,114,715	**745,304,436**
15.	**සිදු කරමින් පවතින කාර්යයන්**		
	ආරම්භක ශේෂය	458,346,684	-
	පෙර වර්ෂයේ ගැලපීම		367313851.65
	පෙර වර්ෂයේ ගැලපීම ප්‍රතිවර්ත කිරීම ප්‍රවර්තන	(458,346,684)	(367,313,852)
	වර්ෂය සඳහා WIP	79,938,521	458,346,685
	අවසන් ශේෂය	**79,938,521**	458,346,684
16.	**වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ**		
	වෙළඳ ලැබිය යුතු දෑ (සටහන 16.1)	9,030,258,468	8,423,304,087
	වෙනත් ලැබිය යුතු දෑ (සටහන 16.2)	137,859,654	60,673,853
	තැන්පත්, පෙර ගෙවීම් සහ අත්තිකාරම් (සටහන 16.3)	161,460,776	180,585,739
		9,329,578,897	**8,664,563,679**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

දෙසැම්බර් 31 වැනි දිනට		CESL	
		2019 රු.	2018 රු.
16.1.	**වෙළඳ ලැබිය යුතු දෑ**		
	ණයගැතියන්	4,151,195,129	4,059,164,389
	පාරිභෝගිකයන්ගෙන් ලැබිය යුතු මුදල	2,508,618,546	2,349,667,271
	රඳවාගත් ලැබිය යුතු දෑ	2,481,578,557	2,125,606,192
	අඩුකිරීම - අගය අඩු වීම සඳහා වෙන්කිරීම (සටහන 16.1.1)	(111,133,765)	(111,133,765)
		9,030,258,468	**8,423,304,087**
16.1.1	**අගය අඩු වීම සඳහා ප්‍රතිපාදන**		
	ණයගැතියන්	111,133,765	8,023,681
	අපේක්ෂිත අලාභ සඳහා ප්‍රතිපාදන		
	පෙර වර්ෂයේ ගැලපීම් (ප්‍රතිපාදන)	-	103,110,084
		111,133,765	**111,133,765**
16.2.	**පෙර වර්ෂයේ ගැලපීම් (ප්‍රතිපාදන)**		
	WHT අඩු කිරීම - ගෙවීම්වලින්	1,096,623	1,042,612.21
	කාර්ය මණ්ඩල ණය	7,006,284	4,651,621
	පෙරගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය	853,565	679,678
	නැවත ගෙවිය යුතු තැන්පත්	13,217,874	8,472,550
	වෙනත් බදු	82,308,986	
	විවිධ ණයගැතියන්	33,376,321	45,827,392
		137,859,654	**60,673,853**
16.3.	**තැන්පත්, පෙරගෙවීම් සහ අත්තිකාරම්**		
	ගෙවූ සේවයේ යෙදවීමේ අත්තිකාරම්	47,897,966	33,195,856.20
	ගෙවූ තැන්පත්	-	-
	අත්තිකාරම්	99,483,920	135,956,505
	පෙරගෙවීම්	14,078,889	11,433,378
		161,460,776	**180,585,739**
17.	**මුදල් හා මුදල් හා සමාන දෑ**		
	හිතකර ශේෂයන්		
	අතේ සහ බැංකුවේ ඇති මුදල්	310,618,571	246,154,904
	සංසරණයේ පවතින මුදල්	629,558	81,909,930
	අහිතකර ශේෂයන්		
	බැංකු අයිරා	-	(30,419,679)
	මුදල් ප්‍රවාහ අරමුණු සඳහා මුදල් හා මුදල් හා සමාන දෑ	311,248,129	297,645,155

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

දෙසැම්බර් 31 වැනි දිනට		CESL	
		2019 රු.	2018 රු.
18.	අර්ථ දැක්වූ ප්‍රතිලාභ බැඳීම		
(a)	**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණයන් පහත පරිදි නිශ්චය කරනු ලැබේ:**		
	ජංගම වර්ෂය ආරම්භයේදී ශේෂය	8,527,850	4,578,004
	ප්‍රවර්තන සේවා පිරිවැය	3,968,579	3,217,479
	පොලී පිරිවැය	980,703	480,690
	වර්ෂය තුළ ආයුගණක අලාභය /(ලාභය)	359,907	683,106
		13,837,039	8,959,280
	ගෙවූ ප්‍රතිලාභ	(765,976)	(431,430)
	වර්ෂය අවසානයේදී ශේෂය	**13,071,063**	**8,527,850**
(b)	**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේදී හඳුනාගත් බැරකම**		
	2019 දෙසැම්බර් 31 දිනට වගකීම්වල වර්තමාන වටිනාකම	13,071,063	8,527,850
	හඳුනානොගත් ආයුගණක ලාභ (අලාභ) /	-	-
	මූල්‍ය තත්ත්වයේ ශුද්ධ බැරකම	**13,071,063**	**4,578,004**
(c)	**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණයන් පහත පරිදි වේ:**		
	පොලී පිරිවැය	980,703	480,690
	ජංගම සේවා පිරිවැය	3,968,579	3,217,479
		4,949,282	**3,698,169**
(d)	**වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගත් ප්‍රමාණයන් පහත පරිදි වේ:**		
	හඳුනාගත් ආයුගණක අලාභය / (ලාභය)	359,907	683,106
		359,907	**683,106**

2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19- සේවක ප්‍රතිලාභ)2012 සංශෝධිතමණින් නිර්දේශ කර ඇති පරිදි සූත්‍ර ක්‍රමය මත (පදනම් වේඅදාළ බැඳීමට එරෙහිව . .වත්කම්වල වටිනාකම රු 13,927.80 ක් (ස්ථාවර තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම්)ගොඩනගා ඇත.

ගණනය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පනවලට පහත සඳහන් දේ ඇතුළත් වේ;

වට්ටම් අනුපාතිකය	වාර්ෂිකව %11.50
වැටුප් වැඩි කිරීමේ අනුපාත	2%
කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත :	වයස අවුරුදු %9 දක්වා 54ක් සහ ඉන් පසුව %0
විශ්‍රාමික වයස	අවුරුදු 60
මරණ අනුපාතය :	A මරණ වගුව 70/1967

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.)

දෙසැම්බර් 31 වැනි දිනට		CESL	
		2018 රු.	2017 රු.
19.	**විලම්භිත බදු**		
	වර්ෂය ආරම්භයේදී ශේෂය	**32,162,145**	**22,581,183**
	වර්ෂය සඳහා වෙන් ප්‍රතිපාදන	9,603,481	9,580,962
	වර්ෂය අවසානයේදී ශේෂය	**41,765,625**	**32,162,145**
20.	**වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ**		
	වෙළඳ ගෙවිය යුතු (සටහන 20.1)	10,314,890,536	10,255,474,444
	වෙනත් ගෙවිය යුතු (සටහන 20.2)	96,634,281	232,017,423
		10,411,524,817	**10,487,491,867**
20.1.	**වෙළඳ ගෙවිය යුතු දෑ**		
	ණයහිමියන්	2,591,988,115	2,521,116,255
	පාරිභෝගියන්ට ගෙවිය යුතු	2,289,741,596	2,828,360,228
	සේවයේ යෙදවීමේ සහ වෙනත් අත්තිකාරම්	4,863,998,184	4,411,522,130
	කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රඳවාගැනීම්	569,162,640	494,475,831
		10,314,890,536	**10,255,474,444**
20.2.	**වෙනත් ගෙවිය යුතු දෑ**		
	ගෙවිය යුතු EPF	3,994,276	1,642,055
	ගෙවිය යුතු ETF	590,968	905,491
	ගෙවිය යුතු යසස ණය	126,774	457,306
	ගෙවීම්වලින් WHT අඩු කිරීම	7,175,720	31,705,626
	වෛද්‍ය රක්ෂණ අඩු කිරීම	675,732	119,850
	මරණාධාර අඩු කිරීම	-	152,000
	විවිධ ණයහිමියන් උපචිත	20,574,712	102,319,705
	වියදම්	40,138,607	47,546,485
	නොගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය	19,007,642	8,006,890
	PAYE බදු	4,349,850	4,876,749
	වෙනත් බදු	-	34,285,266
		96,634,281	**232,017,423**
21.	**ගෙවිය යුතු ආදායම් බදු**		
	වර්ෂය ආරම්භයේදී ශේෂය	**48,014,357**	**37,502,357**
	වර්ෂය සඳහා ආදායම් බදු	55,782,900	42,056,740
	පසුගිය වර්ෂයට අදාළව ප්‍රතිපාදන	**(22,454,577)**	-
	වර්ෂය තුළ සිදුකළ ගෙවීම්	(62,617,873)	(24,196,297)
	රඳවාගැනීමේ බදු (WHT)	(9,116,769)	(7,348,443)
	වර්ෂය අවසානයේදී ශේෂය	**9,608,038**	**48,014,357**

2019 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

21. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු

21.1. මව් සමාගම සමඟ ගනුදෙනු

අ) ඉංජි. ජී. ඩී. ඒ. පියතිලක මහතා CESL හි සභාපතිවරයා වන අතර ඉංජි. එන්. රූපසිංහ මහතා, ඉංජි. එස්. පී.පී. නනායක්කාර මහතා, ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න මහතා, ඉංජි. ඒ. ගල්කැටිය මහතා සහ ඉංජි. ජී. ආර්.ඒ්. එස්. ගුණතිලක මහතා 2019 දෙසැම්බර් 31 දින වනවිට CESL හි අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කර ඇත.

තවද, CESL හි ප්‍රධාන කළමනාකරණ පිරිස පහත පරිදි වේ;

නම	තනතුර	මූලික කාර්යාලය
ඉංජි. එල්.ඩබ්ලිව්.ජේ.එන්. අල්විස් මහතා	ප්‍රධාන විධායක නිලධාරි	
ඉංජි. පී.එම්.පී.සී. ගුණතිලක මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	නැ.හිර සහ ගි.කොන
ඉංජි. ජේ.ඩී. සුනිල්	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	දකුණ
ඉංජි. එච්.ආර්.ඩබ්ලිව්.කේ. හීන්දෙණිය මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	WP1 & NW
ඉංජි. එච්.එම්.ටී.එන්. ධනවර්ධන මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	WP2
ඉංජි. පුෂ්පරාජා මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	උතුර
ඉංජි. ඩබ්.ඊ්.පී. රන්ජන් කුමාර මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	සබරගමුව
ඉංජි. ඩී.එම්.සී.කේ. දසනායක මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	ඌව
ඉංජි. එම්.එන්. ගුණසේන මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	මධ්‍යම පළාත
ඉංජි. එස්.බී.ඒ.ඩී. සේමසිංහ මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	MKDP
ඉංජි. ජේ.ඒ.ඩී.ආර්. සුජිත් කුමාර මහතා	ප්‍රධාන මෙහෙයුම් ඉංජිනේරු	අනුරාධපුර
ජේ.එම්.බී. ජයවීර මහතා	ප්‍රධාන මූල්‍ය නිලධාරී	

ආ) ගනුදෙනුවල ස්වභාවය	මුදල 2019 රු.
ඉදිකිරීම් ආදායම	3,379,209,336
වාහන කුලී ආදායම	19,868,125

21.2. සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනුවල නියමයන් සහ කොන්දේසි

සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබෙන ආදායම සහ දරන ලද වියදම් හෝ සම්බන්ධිත පාර්ශවයන්ගෙන් මිලදී ගැනීම් සිදු කරනු ලබන්නේ **එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවට මත බලපෑම් සිදු නොකරන ස්වාධීන ගනුදෙනුවල** පවතින නියමයන්ට සමානවය. වර්ෂය අවසානයේ හිඟ ශේෂයන් අනාරක්ෂිත වන අතර පොලී රහිත සහ පියවීම මුදල්වලින් සිදු වේ. සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු දේ හෝ ගෙවිය යුතු දේ සඳහා කිසිදු සහතිකයක් ලබා දී හෝ ලැබී නොමැත. මෙම සටහන මෙම මූල්‍ය ප්‍රකාශනවල අංක 19 සමඟ ඒකාබද්ධව කියවිය යුතුය.

ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ ගනුදෙනු

LKAS 26 - 'සම්බන්ධිත පාර්ශව අනාවරණයන්' ට අනුව, ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා බලය සහ වගකීම ඇති පිරිස ප්‍රධාන කළමනාකරණ පිරිස් වේ. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ඇතුළුව) CECB/සමූහයේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස වර්ගීකරණය කර ඇත.

ප්‍රධාන කළමනාකරණ පිරිස් වෙත ගෙවා ඇති වන්දි

	2018	2019
	රු.	රු.
වැටුප් සහ වෙනත් සේවක ප්‍රතිලාභ	1,541,813	1,252,250

22. බැඳීම් සහ අවිනිශ්චිතාවයන්

වාර්තා කරන දිනයට CESL හි සැලකිය යුතු බැඳීම් සහ අනිශ්චිත බැරකම් නොමැත.

10 වර්ෂ හයක සාරාංශය

		2014	2015	2016	2017	2018	2019
ලාභ හෝ අලාභය සහ වෙනත් ප්‍රකාශය							
විස්තීර්ණ ආදායම් පිළිබඳ වැදගත් සටහන්							
ආදායම	රු.මි.	4,960	6,560	8,691	12,294	11,189	10,474
දළ ලාභය	රු.මි.	254	448	621	682	786	781
EBITDA	රු.මි.	236	255	192	196	232	212
EBIT	රු.මි.	132.8	106	54	45	67	55
ශුද්ධ මූල්‍ය ආදායම	රු.මි.	(1.0)	11.3	56	112	105	151
බදු පසු ලාභය	රු.මි.	103	81.1	84.5	120.8	121.4	141.4
අයිතිකරුවන්ට ඒකතු විය යුතු ලාභය	රු.මි.	103	81.1	84.5	120.8	121.4	141.4
මූල්‍ය තත්ත්වය ප්‍රකාශය පිළිබඳ වැදගත් සටහන්							
දේපල, පිරියත සහ යන්ත්‍රෝපකරණ	රු.මි.	402	401	396	479	435	473
එකතුව - ජංගම නොවන වත්කම්	රු.මි.	440	407	398	479	435	473
මුදල් හා මුදල් හා සමාන දෑ	රු.මි.	171	178	207	229	328	311
කෙටි කාලීන තැන්පතු	රු.මි.	257.0	771	1,046	1,111	1,985	1,759
මුළු වත්කම්	රු.මි.	5,729	6,385	9,942	12,345	12,616	12,681
ප්‍රකාශිත ප්‍රාග්ධනය	රු.මි.	10,000,020	10,000,020	10,000,020	10,000,020	10,000,020	10,000,020
රඳවාගත් ඉපැයුම්	රු.මි.	127	208	292	412	411	594
අයිතිකරුවන්ට ඒකතු විය යුතු සමාන දෑ	රු.මි.	137	218	303	422	421	604
මුළු ජංගම නොවන වගකීම්	රු.මි.	1,285	1,166	1,394	1,592	1,629	1,655
මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ වැදගත් සටහන්							
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය	රු.මි.	605	666	368	194	912	(227)
ආයෝජන ක්‍රියාකාරකම්වල භාවිතා කළ මුදල් ප්‍රවාහය	රු.මි.	(523)	(651)	(338)	(172.0)	(844.7)	241.5
මූල්‍ය ක්‍රියාකාරකම්වල / (භාවිතා කළ) මුදල් ප්‍රවාහය	රු.මි.	(0.07)	(7.8)	(0.88)	-	-	-
ප්‍රධාන මූල්‍ය අනුපාත							
EPS	රු.	6,186	812	845	1,202.6	1,208.0	1,410.7
කොටසක ශුද්ධ වත්කම්	රු.	1,369	2,181	3,026	4,229	4,211	6,049
ROE		75%	37%	28%	28%	29%	23%
වත්මන් අනුපාතය		1.2	1.2	1.2	1.1	1.2	1.2
ඉක්මන් අනුපාතය		1.16	1.1	1.06	1.07	1.08	1.10

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂවරයාගේ චේතනය රු. 1,252,250 කි.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකවරයාගේ ගාස්තුව රු. 1,971,880 කි.

සංයුක්ත තොරතුරු

සමාගමේ නම

සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්

මව් සමාගම

ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම
උපදේශන කාර්යාංශය

සමාගමේ ලියාපදිංචි අංකය

PV 16723
(2007 අංක 7 දරන සමාගම් පනත)

ලියාපදිංචි කාර්යාලය

අංක. 415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7, ශ්‍රී ලංකාව
දුරකථනය: (+94)11 2668800
ෆැක්ස්: (+94)11 2668972
ඊමේල්: info@cesl.lk
වෙබ් අඩවිය: www.cesl.lk

නීතිමය තත්ත්වය

සීමිත වගකීම් සහිත පෞද්ගලික සමාගමකි

බැංකුකරුවන්

ලංකා බැංකුව
මහජන බැංකුව

සමාගම් ලේකම්වරුන්

පී. අයි. අබේගුනවර්ධන මිය
අංක 415, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7, ශ්‍රී ලංකාව

විගණකවරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

විගණන කමිටුව

ඉංජි. ටී.ඩී. වික්‍රමරත්න මහතා - කමිටුවේ සභාපති
එම්. ආර්. ජී. රණතුංග මහතා - අධ්‍යක්ෂ (CESL)
ඉංජි. ඒ. ගල්කැටිය මහතා - අධ්‍යක්ෂ (CESL)

අධ්‍යක්ෂ මණ්ඩලය

ඉංජි. ජී.ඩී.ඒ. පියතිලක මහතා - සභාපති
ඉංජි. එස්. පී.පී. නනායක්කාර මහතා - විධායක අධ්‍යක්ෂ
ඉංජි. එන්. රූපසිංහ මහතා - අධ්‍යක්ෂ ඉංජි. ටී. ඩී. වික්‍රමරත්න මහතා - අධ්‍යක්ෂ
ඉංජි. ඒ. ගල්කැටිය මහතා - අධ්‍යක්ෂ
ඉංජි. ජී.ආර්.ඒ.ඒස්. ගුණතිලක මහතා - අධ්‍යක්ෂක

ප්‍රධාන ක්‍රියාකාරකම්

සිවිල් ඉදිකිරීම් කටයුතු සඳහා ගොඩනැගිලි, මාර්ග, පාලම්, යාන්ත්‍රික හා විදුලි වැඩ, ජල සම්පාදන හා අප ජල පවිත්‍රකරණය, පස් ප්‍රවාහනය, වාරිමාර්ග හා ජලාපවහන කටයුතු ඇතුළත් වේ.

සහතිකකරණය

තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා
ISO 9001:2015
පරිසර කළමනාකරණ පද්ධතිය සඳහා
ISO 14001:2015
වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂණ පද්ධතිය සඳහා
ISO 45001:2018

2019 CESL වාර්ෂික වාර්තාව

සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක. 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව

දුරකථන : *(+94)11 2668 800*

ෆැක්ස්: *(+94)11 2668 972*

ඊමේල් : *info@cesl.lk*

වෙබ් අඩවිය: *www.cesl.lk*

සැලසුම සහ නිෂ්පාදනය සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්

වාර්ෂික වාර්තාව 2019© ප්‍රකාශන හිමිකම් ඇවිරිණි